2018 වර්ෂය සඳහා

# කාර්යසාධන වාර්තාව
# සහ
# වාර්ෂික ගිණුම්

# වාණිජ දෙපාර්තමේන්තුව

## [295 වන ශීර්ෂය]

*4 වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක: 21, වොක්ෂෝල් වීදිය,*
*කොළඹ 02*
*දුරකථන:* ***011- 232 9733 / 243 6114***
*ෆැක්ස්:* ***011 -243 0233***
*විද්‍යුත් තැපැල:* *fortrade@doc.gov.lk*
*වෙබ් අඩවිය:* *www.doc.gov.lk*

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1 | හැඳින්වීම | 01 |
| 2 | ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය - **2018** | 04 |
| 3 | බහු පාර්ශ්වික වෙළඳ සබඳතා | 12 |
| 4 | ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාවය | 18 |
| 5 | කලාපීය ආර්ථික සහයෝගීතාවය | 21 |
| 6 | වෙළඳ, ආයෝජන හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය | 25 |
| 7 | ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම | 38 |
| 8 | වාර්ෂික ගිණුම් - **2018** | 40 |

## වගු ලැයිස්තුව


| | පිටුව |
|---|---|
| ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන, සමස්ත අපනයන, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය (2010-2018) | 06 |
| වාණිජ නිලධාරීන් විසින් සිදුකර ඇති ක්‍රියාකාරකම්වල සාරාංශය (2018) | 27 |
| 2012-2018 දක්වා නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික පත් (අදාළ ගිවිසුම අනුව) | 39 |
| වාර්ෂික ගිණුම් -2018 | 40-41 |


## ප්‍රස්තාර ලැයිස්තුව


| | පිටුව |
|---|---|
| වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන | 02 |
| වාණිජ දෙපාර්තමේන්තුවේ සබඳතා | 03 |
| ලංකාවේ අපනයන හා ආනයන සංයුතිය | 07-08 |
| විදේශ වෙළඳාමේ දිශානතිය (2016 - 2018) | 09-11 |

## 1. හැඳින්වීම

**දැක්ම**

*''ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම''*

**මෙහෙවර**

***''සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම් වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.''***

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගු කාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්ය භාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ.

ඒ අනුව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් පහත සාරාංශයෙන් දැක්වේ.


- අදාළ රේඛීය අමාත්‍යාංශ/ අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳව විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගු කාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.

- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචිත වර්ෂය තුළදී, විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම්ව වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අනුව, 2018 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කර ගැනීම, නව වෙළඳ පොළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර වෙළඳපොළ පද්ධතිවලදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය (SME) අංශයේ ඵලදායි සහභාගිත්වය දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ කේන්ද්‍රස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. ඍජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹ ප්‍රවර්ධනය මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ සහාය ද වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින් ලබා දී ඇත.

# වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන





<u>කෙටි යෙදුම්</u>

| | |
|---|---|
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| AD | සහකාර අධ්‍යක්ෂ |
| CRO | වාණිජ පර්යේෂණ නිලධාරී |
| Mgt. Asst. | කළමනාකරණ සහකාර |
| OES | කා.කා.සහායක |

*ඉහළම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් (අධ්‍යක්ෂ මට්ටමේ) තානාපති/ නිත්‍ය නියෝජිත වශයෙන් ලෝක වෙළඳ සංවිධානය, වොෂින්ග්ටන්, ලන්ඩන්, බ්‍රසල්ස්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ කරච්චි යන ස්ථානවල දූත මණ්ඩල සඳහා පත් කිරීම අවශ්‍ය වේ.

** දැනට මෙම අංශවල ප්‍රධානත්වය දරන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරු විසිනි.

## අපගේ සබඳතා


රේඛීය අමාත්‍යාංශය හා වෙනත් රජයේ ආයතන
ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් වෙළඳ කටයුතු සම්බන්ධ සංවිධාන
වෙළඳ මණ්ඩල
කලාපීය හා ද්වීපාර්ශ්වික වෙළඳ ගිවිසුම්
සම්බන්ධී කරණ කටයුතු
කේන්ද්‍රීය ආයතනය ලෙස
වෙළඳ ප්‍රවර්ධන සංවිධාන
වරණීය වෙළඳ ගිවිසුම්
පෞද්ගලික අංශය
වෙළඳ හා ආර්ථික සහයෝගිතාවය සඳහා වන ඒකාබද්ධ කමිටු

## 2. 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

2018 වර්ෂය සඳහා වූ විදේශ වෙළඳාම පිළිබඳ දැක්ම මඟින් වෙළඳ පොළ ප්‍රවේශ අවස්ථා සහ වසර මුළුල්ලේ පැවති අභ්‍යන්තර හා බාහිර අභියෝගවල බලපෑම් නිරූපණය කෙරේ. විදේශීය අංශයෙහි මිශ්‍ර ප්‍රතිඵල නිරීක්ෂණය කරන ලදී. ගෝලීය මූල්‍ය අර්බුදය පැන නැඟීමෙන් පසු පළමු වරට, දියුණු ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධනයේ සමතුලිත බවක් වාර්තා විය. මෙම ආර්ථික අතරින් කිහිපයක් වනුයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ ගමනාන්ත වන ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, එක්සත් රාජධානිය හා ජපානය වේ. එසේ වුවද, 2018 වර්ෂයේදී ලෝක භාණ්ඩ වෙළඳාම 4.4%ක මට්ටමේ මන්දගාමී වීමක් සිදුවිය. ඇමරිකා එක්සත් ජනපදය හා චීනය විසින් එකිනෙකාට විරුද්ධව නිරන්තරයෙන් පනවනු ලබන වෙළඳ සීමා කිරීම් මාලාව මෙම භූදේශපාලනික අස්ථාවරභාවය කෙරෙහි දායක විය. මීට අමතරව, මැද පෙරදිග ආර්ථිකයන්ගේ මන්දගාමී වර්ධනය ද, අනෙකුත් වෙළඳ පාර්ශවකරුවන්ගේ වෙළඳ ආරක්ෂණවාදී පියවර ද ශ්‍රී ලංකාවේ වෙළඳාම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී.

2017 මැයි මාසයේ සිට යුරෝපා සංගමය මඟින් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ සහිත වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (EU GSP +) නැවත ලබාදීම යම්තාක් දුරකට හේතු වීම නිසා අපනයන මඟින් ඉපැයූ ආදායමේ ද්වි අංකිත වන 10%ක සැලකිය යුතු වර්ධනය හමුවේ වුවද, අහිතකර කාලගුණික තත්වයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් අනපේක්ෂිතව ඉහළ ගිය ආනයන සහ නොවෙනස් වූ ජාත්‍යන්තර පාරිභෝගික භාණ්ඩවල මිල හේතුවෙන් වෙළඳ ශේෂ පරතරය ඉහළ ගොස් ඇති බව 2017 මහ බැංකු වාර්තාවේ හඳුනාගෙන ඇත. සංචාරක කර්මාන්තය මඟින් ඉපැයූ මධ්‍යස්ථ ආදායම, දේශීය ඉතුරුම් වල අඩු වර්ධන වේගය, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීම, දේශීය ඉතිරුම් වල අඩු වර්ධන වේගය, පොලී ගෙවීම් සහ සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ප්‍රතිආයෝජනය කරන ලද ඉපැයීම් ඉහළ යෑම් ද සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ විදේශීය ජංගම ගිණුමේ ශේෂය තවදුරටත් ද්වි අගයක ශේෂයකට පිවිසීමට හේතු සාධක විණි.

ඉන්දියන් සාගරයේ වාණිජ කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම සඳහා හඳුනාගත් ආර්ථික ක්‍රමෝපාය සමඟින් විදේශ වෙළඳාමේ ඉදිරි දිශානතිය, 2017 වර්ෂයේදී ප්‍රකාශයට පත්කළ ශ්‍රී ලංකා රජයේ 2025 ඉදිරි දැක්මේ ඇතුළත් වේ. ඉදිරි වසර කිහිපය තුළ ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායමක් ලබන රටක් බවට පත් කිරීම සඳහා රටේ ඒක පුද්ගල ආදායම එ.ජ. ඩොලර් 5,000 දක්වා ඉහළ දැමීම, නව රැකියා මිලියනයක් උත්පාදනය කිරීම, වර්ෂයකට ඇමරිකන් ඩොලර් බිලියන 5 දක්වා සෘජු විදේශ ආයෝජන ඉහළ දැමීම මෙන්ම වත්මන් අපනයනයන් දෙගුණ කර වර්ෂයකට ඇමරිකන් ඩොලර් බිලියන 20 දක්වා ඉහළ දැමීම එහි අරමුණු අතර වේ.

විදේශ වෙළඳාම වැඩි දියුණු කිරීම, ඉන්දියන් සාගරයේ අපනයනාභිමුඛ ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා උපකාරී වේ. ගෝලීය අපනයන සහ දළ දේශීය නිෂ්පාදනය සඳහා පවතින අඩු අපනයන දායකත්වය සහ මන්දගාමී සෘජු විදේශ ආයෝජන අවශෝෂණ සම්බන්ධ වර්තමාන අභියෝග සඳහා පිළියම් යෙදිය යුතු වේ. අපනයන භාණ්ඩවල තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම, අපනයන භාණ්ඩවල පටු සංයුතිය විවිධාංගිකරණය කිරීම, අපනයන ගමනාන්ත පුළුල් කිරීම, සේවා අපනයන හඳුනාගැනීම, ගෝලීය වෙළඳ පොළට අවතීර්ණ වීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම, ගෝලීය අගය දාම වෙත එකතුවීම සඳහා ඉහළ අගය එකතු කළ හා ඉහළ තාක්ෂණික මට්ටමකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන හා කාර්මික අංශ විවිධාංගීකරණය හා දැනුම පාදක කර්මාන්ත සඳහා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම, උක්ත සඳහන් කළ වැඩි දියුණු කිරීම්, රටේ තිරසාර ආර්ථික වර්ධනය හා ඉලක්කගත අරමුණු හා දැක්ම සාක්ෂාත් කර ගැනීම හා තහවුරු කර ගැනීම සඳහා හඳුනාගත් ප්‍රධාන අංශ වේ.

තවද, එසේ කටයුතු කිරීමේදී දේශීය සැපයුම හා ධාරිතා සංරෝධක, ප්‍රමිති ආශ්‍රිත ගැටලු ඇතුළුව අපනයන තරඟකාරිත්වය, භාණ්ඩ හා සේවා සඳහා අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම්, ශ්‍රී ලංකාවේ එතෙර අපනයන සඳහා බලපාන්නා වූ තීරු බදු නොවන සාධක, ලෝක බැංකුවේ (WB) ව්‍යාපාර කිරීමේ පහසුව (Ease of Doing Business) හා ලෝක ආර්ථික සංසදයේ (WEF) ගෝලීය තරඟකාරිත්වය (Global Competitiveness) වැනි ජාත්‍යන්තර ආයෝජන දර්ශක/ප්‍රමිති ආදියෙහි ඉහළ ස්ථාන අත්පත් කර ගැනීම වැනි හා ඒ හා අනුද්ධිත අත්‍යවශ්‍ය කරුණුවලට පිළියම් යෙදීම සිදු කිරීම තවමත් කළ යුතුව පවතී. සෘජු විදේශ ආයෝජන සැලකූ විට, යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජන මඟින් තවමත් කර්මාන්ත අංශය උත්තේජනය කර නොමැත. නිෂ්පාදන කර්මාන්තවල, කෘෂි ව්‍යාපාරවල හා විකිණිය හැකි සේවාවල සිදුකරන ආයෝජන ආසියාවේ අනෙකුත් ආර්ථිකයන් හා සංසන්දනය කිරීමේදී ඉතා අවම අගයක් ගනී. එබැවින් ශ්‍රී ලංකාව වෙත

වඩාත්ම ප්‍රයෝජනවත් ආයෝජන ව්‍යාපෘති ආකර්ෂණය කරගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

ආර්ථික සබඳතා මෙහෙයවීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සමඟින්, වෙළඳ පාර්ශවකරුවන් සමඟ ආර්ථික සබඳතා වැඩිදියුණු කරගැනීම හා ස්ථාවර කර ගැනීම, දැනට පවතින හා නව ජාත්‍යන්තර වෙළඳ පොළවල්හි වෙළඳපොළ කොටස්කාරිත්වය තවදුරටත් වැඩිකර ගැනීම, තීරු බදු ක්‍රමය හා බදු සංශෝධන සඳහා යෝජිත සරලකිරීම් ඔස්සේ ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කර ගැනීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීම හා ව්‍යාපාරික මෙහෙයුම් සඳහා පහසුකම් සැපයීම උදෙසා රජය විසින් සිය ප්‍රයත්න අඛණ්ඩවම දියත් කර ඇත.

වෙළඳාම ප්‍රවර්ධනය කිරීම හා ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ද්විපාර්ශ්වික, කලාපීය හා බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය මඟින් අඛණ්ඩව අවධානය යොමු කර ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී, ඒකපාර්ශවීය GSP ක්‍රමය යටතේ ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන්, එනම් යුරෝපා සංගමය හා ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ පැවති එකඟතා ඔස්සේ වෙළඳ පොළ ප්‍රවේශ අවස්ථා ගණනාවක් ඇති කරගැනීමේ අවස්ථාව විවර විය. 2010 අගෝස්තු මාසයේදී GSP ක්‍රමය තාවකාලිකව අත්හිටුවීමෙන් අනතුරුව නැවත 2017 මැයි මාසයේ දී යළි ලබා ගැනීම මඟින් සමාලෝචිත කාලසීමාව තුළ යුරෝපා සංගමය වෙත සිදුකළ අපනයනවල ඉහළ යෑම පෙන්නුම් කෙරේ.
වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ දී හා වෙළඳාම සම්බන්ධ ගැටලු විසඳීමේදී වෙළඳ පාර්ශවකරුවන් සමඟ පවතින අන්‍යෝන්‍ය සහයෝගීතාවය ඒකාබද්ධ කමිටු යටතේ සිදුකළ ද්වීපාර්ශ්වික සාකච්ඡා හා පසු විපරම් කටයුතු මඟින් වැඩි දියුණු වී ඇත.

නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) සහ වරණීය වෙළඳ ගිවිසුම් (PTAs) ඔස්සේ වරණයන්ගේ උපරිම භාවිතය හා වෙළඳ පොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය වෙළඳ පාර්ශවකරුවන් සමඟ තවදුරටත් කටයුතු කරනු ලැබේ. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ (APTA) 4 වන වටයේ වෙළඳ එකඟතා 2017 වර්ෂයේදී සාර්ථක අයුරින් නිම කිරීමෙන් අනතුරුව, එකී 4 වන වටයේ සහන ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම APTA සාමාජික රටවල් වලින් පිරිනමන සහන වලින්, විශේෂයෙන් චීනය සහ දකුණු කොරියාව වෙත වෙළඳ පොළ ප්‍රවේශය වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව වර්තාමනයේ දී වාසි ලබා ගනී. එමෙන්ම, ඉන්දියාව හා පකිස්ථානය සමඟ ඇති කරගත් නිදහස් වෙළඳ ගිවිසුම්වලට අමතරව, සිංගප්පූරුව සමඟ ඇති නිදහස් වෙළඳ ගිවිසුමෙන් ගෝලීය අගය දාම සහ නිෂ්පාදන හවුලේ බෙදාහැරීමේ ජාල ඔස්සේ වඩාත් ආයෝජන හා ව්‍යාපාරික අවස්ථා ඇති කරගැනීම අපේක්ෂා කෙරේ.

බහුපාර්ශ්වික අංශයට අදාළව සැලකූ විට, නියමයන් මත පාදක බහුපාර්ශ්වික වෙළඳ පද්ධති සඳහා සහාය පළ කරන ලෝක වෙළඳ සංවිධානයේ (WTO) සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව, වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (Trade Facilitation Agreement – TFA) ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව දායක විය. මෙය 2016 මැයි මාසයේදී අපරානුමත කරන ලදී. මෙම වෙළඳාම පහසුකරන ගිවිසුම යටතේ වන ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කරමින්, ශ්‍රී ලංකා රජය විසින් ලෝක බැංකුවේ සහයෝගිතාවයෙන් "ශ්‍රී ලංකා වෙළඳ ද්වාරය" (Sri Lanka Trade Portal – SLTIP) ආරම්භ කරන ලදී. 2018 ජූලි මස 20 වන දින ආරම්භ කළ මෙම ශ්‍රී ලංකා වෙළඳ ද්වාරයේ වෙළඳාම ආශ්‍රිත නියාමන තොරතුරු තනි වෙබ් අඩවියක් තුළ අන්තර්ගත වේ. පහසු ප්‍රවේශයක් ඔස්සේ කාලනුරූපීව යාවත්කාලීන වෙළඳාම ආශ්‍රිත තොරතුරු සැපයෙන මෙය දේශසීමා හරහා සිදුවන වෙළඳ කටයුතු පහසු කිරීමේ ප්‍රධාන පියවරකි. වෙළඳ පිරිවැය අඩුකිරීමෙන් හා දේශසීමා හරහා සිදුවන බාධා ඉවත් කරමින් අපනයන තරඟකාරිත්වය වැඩිදියුණු කිරීමෙන් සුමට වෙළඳ ප්‍රවාහයක් අපේක්ෂා කෙරේ. පාර්ශවකරුවන් 41 දෙනෙකු සහයෝගය දක්වන ශ්‍රී ලංකා වෙළඳ ද්වාරය වර්තමානයේ පාලනය කරනු ලබන්නේ වාණිජ දෙපාර්තමේන්තුව විසිනි.

දිගු කාලයක් මුළුල්ලේ පැනවීම ප්‍රමාද වෙමින් පැවති ශ්‍රී ලංකාවේ ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන බදු සහ ආරක්ෂණ පියවර සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීති, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. පිළිවෙලින් 2018 මාර්තු 23 වන දින හා 2018 මාර්තු 19 වන දිනයන්හිදී ගැසට් පත්‍රයේ පළ කිරීමත් සමඟ 2018 අංක 02 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත හා 2018 අංක 03 දරන ආරක්ෂණ පියවර පනත යන පනත් දෙකම බලාත්මක විය. දේශීය වෙළඳ පොළ තුළ අසාධාරණ තරඟයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීමේ අරමුණින් මෙම නීති පනවනු ලැබීය. වෙළඳ

කටයුතු ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව තුළ වෙළඳ ප්‍රතිකර්ම ඒකකයක් ස්ථාපනය කිරීමේ කටයුතුවල දෙපාර්තමේන්තුව නියුක්තව සිටියි.


පුද්ගලික අංශයේ ආයතන දැනුවත් කිරීම සඳහා අපනයන ප්‍රවර්ධන අවස්ථා හා වෙළඳාම සඳහා පහසුකම් ඇති කරලීම සම්බන්ධයෙන් ඔවුන් කරා සමීප වූ වැඩසටහන් ගණනාවක් 2018 වර්ෂය තුළදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. නැවත පනවනු ලැබූ යුරෝපා සංගමයේ GSP+ සහනයේ වාසි, අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය (REX), ශ්‍රී ලංකා වෙළඳ ද්වාරයේ වාසි, වෙළඳ පහසුකම් සැපයීම, ප්‍රභවස්ථාන රීති නිර්ණායක සහ වෙළඳ කටයුතු ආශ්‍රිත වැරදි සඳහා පිළියම් ආදිය සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති කරලීම සඳහා වැඩමුළු ගණනාවක් කොළඹ හා අනෙකුත් පළාත්වල සංවිධානය කරන ලදී.

**2010-2018 දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය**
**(වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන වලිනි.)**

| වර්ෂය | අපනයන | වර්ධනය % | ආනයන | වර්ධනය % | සමස්ත වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| **2010** | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| **2011** | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| **2012** | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| **2013** | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |
| **2014** | 11,044 | 10.3 | 19,246 | 12.6 | 30,290 | -8,202 |
| **2015** | 10,212 | -7.5 | 18,989 | -1.3 | 29,201 | -8,777 |
| **2016** | 10,217 | 0.1 | 19,515 | 2.77 | 29,732 | -9,298 |
| **2017** | 11,411 | 11.69 | 21,324 | 9.27 | 32,735 | -9,913 |
| **2018** | 11,687 | 2.42 | 22,069 | 3.50 | 33,756 | -10,382 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව


## 2.1 අපනයන සහ ආනයන කාර්ය සාධනය




- රෙදිපිළි හා ඇඳුම්පැලඳුම් ආයිත්තම්
- කෝපි, තේ, සාදික්කා සහ කුළුබඩු
- රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන
- ඛනිජ හා එහි ආශ්‍රිත නිෂ්පාදන
- විදුලි යන්ත්‍ර හා උපකරණ හා ඒවායේ කොටස්
- මත්ස්‍යයින් හා අනෙකුත් ජලජ අපෘෂ්ඨවංශීන්
- වටිනා හා අර්ධ වටිනාකමකින් යුතු ගල් සහ ස්වර්ණාභරණ
- ශාකමය රෙදිපිළි තන්තු; කඩදාසි නූල් සහ කඩදාසි නූල් වලින් වියන ලද රෙදි
- එළවළු, පලතුරු, ඇට වර්ග හෝ වෙනත් ශාක කොටස්වලින් පිළියෙල කළ සැකසුම්
- වෙනත්

**2018** වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායම ඇ.ඩො. මිලියන **11,687**ක් වූ අතර **2017** වර්ෂයේදී එම අගය ඇ.ඩො. මිලියන **11,411** කි.


ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායමින් **43%**කට දායකත්වය ලබාදෙමින් ඇඟළුම් ක්ෂේත්‍රය ඉදිරියෙන්ම සිටින අතර, **2017** වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී **1%**ක සුළු ඉහළ යාමක්ද පෙන්නුම් කරයි. **2018** වර්ෂයේදී අපනයන ආදායමට ඇති දායක්තවයෙන් දෙවන ස්ථානය තේ අපනයන **(15%)** සඳහා හිමිවන අතර රබර් හා රබර් නිෂ්පාදන, ඛනිජ නිෂ්පාදන හා විදුලි යන්ත්‍ර හා උපකරණ පිළිවෙලින් **8%, 3%** හා **3%** බැගින් දායකත්වය දක්වා ඇත.





- ඛනිජ ඉන්ධන, ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන
- දුම්රිය මාර්ග හෝ ට්‍රෑම්රථ එන්ජින්, මැදිරි හැර වාහන සහ ඒවායේ අමතර කොටස්
- යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික උපකරණ සහ ඒවායේ කොටස්
- විදුලි යන්ත්‍රෝපකරණ හා යන්ත්‍ර සහ ඒවායේ කොටස්
- වියන ලද හෝ ගොතන ලද රෙදි
- යකඩ හා වානේ
- ප්ලාස්ටික් සහ ආශ්‍රිත නිෂ්පාදන
- කපු නූල්
- වටිනා හා අර්ධ වටිනාකමකින් යුතු ගල් සහ අනුකරණ ස්වර්ණාභරණ
- කඩදාසි සහ කඩදාසි බෝඩ්; කඩදාසි පල්ප් වලින් සැකසූ ද්‍රව්‍ය
- වෙනත්

**2018** වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම, **2017** වර්ෂයේ ආනයන වියදම වූ ඇ.ඩො. මිලියන **21,324** සිට ඇ.ඩො. මිලියන **22,069** දක්වා **3.5%**ක ඉහළ යාමක් සලකුණු කරමින් වැඩි වී ඇත. **2018** වර්ෂයේදී ශ්‍රී ලංකාව සමස්ත ආනයන පරාසය තුළ ප්‍රමුඛස්ථානය ගෙන ඇත්තේ ඛනිජ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වන අතර එය සමස්ත ආනයනවලින් **18%**කි. වාහන හා අමතර කොටස් **(10%)**, යන්ත්‍රෝපකරණ හා උපකරණ **(7%)**, විදුලි යන්ත්‍රෝපකරණ හා උපකරණ **(6%)** සහ රෙදිපිළි **(4%)** අනෙකුත් ප්‍රධාන ආනයන අයිතමයන්ට ඇතුළත් වේ.


## 2.2 2017-2018 දක්වා ශ්‍රී ලංකාවේ වෙළඳ කටයුතුවල දිශානතිය




- ඇමරිකා එක්සත් ජනපදය
- එක්සත් රාජධානිය
- ඉන්දියාව
- ජර්මනිය
- ඉතාලිය
- බෙල්ජියම
- එක්සත් අරාබි එමීර් රාජ්‍යය
- නෙදර්ලන්තය (ඕලන්දය)
- චීනය
- ජපානය




- ඉන්දියාව
- චීනය
- එක්සත් අරාබි එමීර් රාජ්‍යය
- ජපානය
- සිංගප්පූරුව
- මැලේසියාව
- ඇමරිකා එක්සත් ජනපදය
- තායිලන්තය
- ජර්මනිය
- තායිවානය




| අපනයන % | |
|---|---|
| ඇ.එ.ජනපදය | 26 |
| එ.රාජධානිය | 8 |
| ඉන්දියාව | 7 |
| ජර්මනිය | 5 |
| ඉතාලිය | 5 |

| ආනයන % | |
|---|---|
| ඉන්දියාව | 19 |
| චීනය | 19 |
| එ.අ.එමීර් රාජ්‍යය | 8 |
| ජපානය | 7 |
| සිංගප්පූරුව | 6 |

## 3. බහුපාර්ශ්වික වෙළඳ සබඳතා

ශ්‍රී ලංකාවේ බහුපාර්ශ්වික වෙළඳ සබඳතා මඟින් මූලික වශයෙන් ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ද ඇතුළත්ව, වෙනත් බහුපාර්ශ්වික සංවිධාන කිහිපයක් සමඟ ද ශ්‍රී ලංකාව සමීප සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලැබේ.

### 3.1 ලෝක වෙළඳ සංවිධානය තුළ ශ්‍රී ලංකාවේ නියෝජනය;

#### 3.1.1 ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (TFA) යටතේ ඇති බැඳීම් ඉටු කිරීම

2017 පෙබරවාරි මස 22 වන දින අත්සන් තැබූ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (TFA) ගෝලීය වෙළඳ පද්ධතිය තුළ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ලෝක වෙළඳ සංවිධානයේ විසි එක් වසරක ඉතිහාසය තුළ නිමාවට පත් කළ ප්‍රථම බහුපාර්ශ්වික කාර්යය විය. ශ්‍රී ලංකාව එසේ අත්සන් කරනු ලැබූ 81 වන සාමාජිකයා වශයෙන්, සිය අපරානුමත කිරීමේ ලේඛන 2016 මැයි මස 31 වන දින ලෝක වෙළඳ සංවිධානය වෙත භාර දීමට කටයුතු කරන ලදී.

මෙම ගිවිසුමේ ප්‍රකාරව, ගිවිසුම අපරානුමත කරන රටවල් විසින් ගිවිසුම ක්‍රියාත්මක කළ දිනයේ සිට වසරක් සම්පූර්ණ වීමට පෙර එනම් 2018 පෙබරවාරි 22 වන දිනය දක්වා වන කාලසීමාව තුළදී කාණ්ඩ බැඳීම් (category commitments) පිළිබඳ නිවේදනය සකස් කිරීම කළ යුතු වේ. වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ජාතික කමිටුව (NTFC) විසින් ලෝක බැංකු කණ්ඩායමේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ කාණ්ඩ බැඳීම් පිළිබඳ අවසන් නිවේදනය සකස් කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නියමිත කාලසීමාව අවසන් වීමට පූර්වයෙන් TFA කමිටුව වෙත භාරදෙන ලදී. වර්ෂ අවසානය වනවිට, රටවල් 144ක් A කාණ්ඩයේ නිවේදන ඉදිරිපත් කර තිබූ අතර, රටවල් 76 ක් හා 65 ක් විසින් පිළිවෙලින් B කාණ්ඩයේ නිවේදන හා C කාණ්ඩයේ නිවේදන ඉදිරිපත් කර තිබුණි.

වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම මඟින් වෙළඳ පිරිවැය සාමාන්‍ය වශයෙන් 14.3%ක් වැනි අගයකින් අඩුවන බවට ඇස්තමේන්තු කර ඇත. ආනයන කටයුතු සඳහා ගතවන සාමාන්‍ය කාලය 47%කින් පමණ අඩුවන බවටත් ඇස්තමේන්තු කර ඇති අතර, තවද විස්මිත අයුරින් අපනයන සඳහා ගතවන කාලය 91%කින් පමණ අඩුවන බවට ද පුරෝකතනය කර ඇත. වසර 2030 වන විට, මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම මඟින් ගෝලීය අපනයන වාර්ෂිකව 2.7% කින් පමණ වැඩි වීමට දායක වනු ඇති අතර, සංවර්ධනය හා අවම වශයෙන් සංවර්ධිත රටවල් සඳහා මීට වැඩි ප්‍රතිලාභ ද හිමි වනු ඇත. තවද, මෙම ආර්ථිකවල අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සඳහා සාධනීය බලපෑම් ද මෙහි අන්තර්ගත ය.

#### 3.1.2 බහු-දේශයන් ඒකාබද්ධ කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගෝලීය සන්ධානය (Global Alliance for Trade Facilitation- GATF) විසින් ඉන්දියන් සාගරයේ කාර්ය සංවිධාන කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාව ක්‍රමෝපායිකව පිහිටා ඇති බවට හඳුනාගැනීමෙන් අනතුරුව, වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා වන ඔවුන්ගේ සහාය ලබාදීමේ කාර්යයේ කොටසක් ලෙස බහු-දේශයන් ඒකාබද්ධ කිරීමේ කේන්ද්‍රස්ථානයක් (MCCH) ලෙස ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාව තෝරා ගෙන ඇත. ඉන්දියාව හා අනෙකුත් අසල්වැසි රටවල් කරා සහ එම රටවල් වලින් ඉවතට යන ආනයන/අපනයන බහුතරයක් වර්තමානයේ කොළඹ පසුකරමින් යන බැවින් නැව් මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාරයේ නැව් මාරු කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මනා විභවයක් සහිත රටක් ලෙස ගෝලීය සන්ධානය විසින් ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා සෘජු හෝ වක්‍ර ආකාරයෙන් සම්බන්ධ වී ඇති පුද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් 2018 ඔක්තෝම්බර් මස 03 වන දින කොළඹ දී පවත්වන ලද උත්සවයකදී මෙම ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය අදියර 03ක් යටතේ ක්‍රියාත්මක කරනු ඇත. මෙරට තුළ බහු-දේශයන් ඒකාබද්ධ කිරීමේ කේන්ද්‍රස්ථානය සාර්ථකව දියත් කිරීම

සඳහා අවශ්‍ය කෙරෙන නෛතික හා නියාමන පියවර අන්තර්ගත පැකේජයක් කෙටුම්පත් කිරීම පළමු අදියරේ දී සිදු කරනු ඇත. මෙම කේන්ද්‍රස්ථාන පහසුකම වෙත හා ඉන් ඉවතට නැව් භාණ්ඩ ප්‍රවාහනයේදී ගතවන කාල සීමා විස්තර වශයෙන් සකස් කිරීම හා ලේඛන අවශ්‍යතා සම්බන්ධ කටයුතු ද පළමු අදියරේ දී සිදුකරනු ඇත.

ගෝලීය සන්ධානය යනු ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුමේ ප්‍රකාරව සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ප්‍රතිසංස්කරණ වලට සහාය දක්වන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයකි. ශ්‍රී ලංකාවේ මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සිදු කරනුයේ වොෂින්ටන් නගරය මූලික කරගෙන ස්ථාපනය කර ඇති ජාත්‍යන්තර පුද්ගලික ව්‍යවසාය සඳහා මධ්‍යස්ථානය (Centre for International Private Enterprise – CIPE) විසිනි. වෙරයිට් රිසර්ච් ආයතනය හා අයිසීසී ශ්‍රී ලංකා ආයතනය මෙම ව්‍යාපෘතියේ දේශිය සන්ධානගත පාර්ශවකරුවන් වන අතර සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය රජයේ ඍජු පාර්ශවකරු වේ.

### 3.1.3 ධීවර සහනාධාර සඳහා නව බහුපාර්ශ්වික විධිමත් කිරීම්

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක 14.6ට අනුව, වර්ෂ 2020 වනවිට පවත්නා ධාරිතාවට වැඩි සහ අධික ලෙස මසුන් මැරීමට හේතු වන ආකාරවල ධීවර සහනාධාර තහනම් කිරීම, නීතිවිරෝධී, වාර්තා නොවන, නියාමනය නොකළ මසුන් මැරීමට ඉඩ සලසන සහනාධාර ඉවත් කිරීම සහ එවැනි නව සහනාධාර හඳුන්වාදීමෙන් වැළකීම සිදුකළ යුතු බව දැක්වේ.
වෙළඳාම විකෘති කරන ආකාරයේ සහනාධාර විධිමත් කිරීම් ලෝක වෙළඳ සංවිධානයේ සහනාධාර හා ප්‍රතිතෝලන පියවර පිළිබඳ ගිවිසුම (Agreement on Subsidies and Countervailing Measures – SCM) යටතේ ඇත. ලෝක වෙළඳ සංවිධානයේ අමාත්‍ය සම්මේලන ගණනාවකදී, විශේෂයෙන් 2001 වර්ෂයේ නොවැම්බර් මස පැවති දෝහා අමාත්‍ය සම්මේලනයේ දී ධීවර සහනාධාර කළමනාකරණය හා පාලනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. 28 වන හා 31 වන පරිච්ඡේද මඟින් සහනාධාර විධිමත් කිරීමේ කාර්යයේ ලෝක වෙළඳ සංවිධානයේ නියුක්ත වීම විශේෂයෙන් අනුමත කර ඇත.

සමුද්‍ර සම්පත්වල සංරක්ෂණය හා තිරසාර බව කෙරෙහි බලපාන එවැනි සහනාධාර සම්බන්ධයෙන් අවශ්‍ය පාලන පියවර හඳුන්වාදීම ලෝක වෙළඳ සංවිධානයට පැවරී ඇත. ලෝක වෙළඳ සංවිධානයේ සාමාජික රාජ්‍ය විසින් නෛතික බැඳීමක් ස්ථාපනය කිරීමේ අරමුණින්, සංවිධානයේ නියෝග සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණීමේ කමිටුව විසින් ධීවර සහනාධාර විෂය සාකච්ඡාවට ගෙන ඇත. යෝජිත සහනාධාර විධිවිධාන අංශ හතරක් (04) ඔස්සේ යොමුවී ඇත.

- (අ) නියාමනය නොකළ, මසුන් මැරීමට ඉඩ සලසන සහනාධාර
- (ආ) අධික ලෙස මසුන් මැරීම සිදුකර තොග පවත්වා ගැනීමට උපකාරී වන ධීවර සහනාධාර
- (ඇ) අධික ලෙස මසුන් මැරීමට හේතු වන සහ පවත්නා ධාරිතාව වැඩි වන ආකාරවල ධීවර සහනාධාර
- (ඈ) විනිවිදභාවය, ආරවුල් නිරාකරණය, ආයතනික සැලසුම් වැනි අන්‍යෝන්‍ය අන්තර් සම්බන්ධ ගැටලු

ධීවර අංශය මෙරට දිවිපෙවෙත් වල පෝෂණය, රැකියා නියුක්තිය හා රටේ අපනයන ආදායම් උත්පාදන අංශවල ප්‍රධාන ප්‍රභවයක් වන බැවින්, ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකා දූත මණ්ඩලය විසින් ගෝලීය ධීවර සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීමේ යෝජනා සඳහා දායකවන අතර රටේ ජාතික අභිමානාර්ථ ආරක්ෂා කරගැනීම සඳහා සක්‍රිය අයුරින් සාකච්ඡා වල අඛණ්ඩව නිරතව සිටියි.

දැනට ඉටුකරගෙන යමින් පවතින එකඟතා සාකච්ඡා වල දී ශ්‍රී ලංකාව විසින් ඉටුකරනු ලබන සක්‍රිය භූමිකාවට සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාව incubator process ක්‍රියාවලිය තුළ ඇතුළත් කළ යුතු රටක් වශයෙන් තෝරා ගෙන ඇත. 2020 වනවිට ප්‍රතිඵලයක් කරා ළඟා වීමේ අරමුණින් ධීවර සහනාධාර විධිමත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම මෙමඟින් යෝජනා කර ඇත. ලෝක වෙළඳ සංවිධානයේ සමස්ත සාමාජික රටවල් සංඛ්‍යාවෙන් රටවල් 38 ක් පමණක් මෙම ඉන්කියුබේටර් කණ්ඩායමේ සාමාජිකයන් වශයෙන් තෝරා ගෙන ඇත.

තවද, කලාපීය මට්ටමින් ශක්‍යතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම සඳහා වන නව යෝජනාවක් ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කළ අතර, එමඟින් කලාපීය සංවර්ධනය වෙමින් පවතින රටවල ධීවර ක්ෂේත්‍රය සම්බන්ධ විශේෂඥයන් හා ලෝක වෙළඳ සංවිධානයේ විශේෂඥයන් ඒකරාශි කරනු ලැබේ. මෙහි අරමුණ වනුයේ යෝජිත සහනාධාර විධිමත් කිරීමේදී මෙම විශේෂඥ කණ්ඩායම් දෙක අතර පවතින දැනුම් පරතරය පියවීමයි. කවුන්සිලයේ සියලුම සාමාජිකත්වයේ අවධානය හා ලේකම් කාර්යාලයේ පෙළඹවීම ලබා ගැනීමට මෙම යෝජනාව සමත් විය. මෙම යෝජනාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ආසියා හා ශාන්තිකර කලාපය සඳහා එක්දින වැඩමුළුවක් කොළඹ දී සංවිධානය කරන ලෙස දූත මණ්ඩලය විසින් ලේකම් කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. එම ඉල්ලීම පිළිගෙන තිබෙන අතර ආසියාව සඳහා කලාපීය වැඩමුළුවක් 2019 මැයි මාසයේදී කොළඹ දී පැවැත්වීම සඳහා එකඟ වී ඇත.

### 3.1.4 ලෝක වෙළඳ සංවිධානය සමඟ කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධ එකඟතා

කෘෂිකාර්මික අංශය ප්‍රතිසංස්කරණය කිරීමට සහ කෘෂිකාර්මික වෙළඳාම අඩපණ කරන සහනාධාර හා ඉහළ වෙළඳ බාධක සම්බන්ධයෙන් විසඳුම් සෙවීම සඳහා WTO සාමාජිකයන් විසින් පියවර ගෙන ඇත. එහි සමස්ත අරමුණ වනුයේ වෙළඳ පොළ ප්‍රවේශය ඉහළ නැංවීම හා ලෝකය පුරා විසිරී සිටින ගොවි ජනතාවගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා සාධාරණ වෙළඳ පද්ධතියක් ස්ථාපනය කිරීමයි.
මෙම වර්ෂය තුළදී ශ්‍රී ලංකාව විසින් දේශීය සහාය (2014-2016) සහ අපනයන සහනාධාර (2015-2017) වලට අදාළව කෘෂිකාර්මික නිවේදන නිකුත් කර ඇත.

### 3.2 ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාණිජ්‍යය සූදානම පිළිබඳ තක්සේරුව

සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින කර්මාන්ත හා වෙළඳ පරිසරයෙන් වාසි අත්පත් කරගැනීමේ අපේක්ෂාවෙන්, විශේෂයෙන් රජයේ 2025 සංවර්ධන න්‍යාය පත්‍රය සැලකීමේදී, රටෙහි ඩිජිටල් යටිතල පහසුකම්වල අවශ්‍යතාවය, පවතින පරතරයන් හා එහි විද්‍යුත් වාණිජ්‍යය සූදානම හඳුනාගත් ප්‍රමුඛතා වේ.
වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ඩිජිටල් බෙදීම නැති කර එමඟින් ගතික ගෝලීය වෙළඳ පරිසරයෙන් තිරසාර වූ වරප්‍රසාද ලබාගැනීම තහවුරු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරයි. විද්‍යුත්-වාණිජ්‍යය සඳහා අවශ්‍ය කෙරෙන ඩිජිටල් යටිතල පහසුකම් දියුණු කරගැනීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල්වලට සහාය ලබාදීම සඳහා ලෝක මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආධාර දෙන සංවිධාන හා සංවර්ධිත රටවල් බැඳී සිටියි. ඒ අනුව, රජයේ සංවර්ධන න්‍යාය පත්‍රය සම්බන්ධ ඉදිරි කටයුතු කර ගෙන යෑමේ හා විද්‍යුත්-වාණිජ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා ශ්‍රී ලංකාව වෙත ආධාර දෙන සංවිධානවල අවධානය යොමු කර ගැනීමේ අභිප්‍රායෙන් යුතුව UNCTAD සංවිධානයේ හා ලෝක බැංකු කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ මූලික සාකච්ඡා පවත්වා ඇත.

මෙම ප්‍රයත්නයේදී, වඩාත්ම වැදගත් කර්තව්‍යය වනුයේ වෙළඳාම පහසු කිරීමේ මෙවලම්, ඩිජිටල් ගනුදෙනු, කෘත්‍රිම බුද්ධිය භාවිතා කිරීම වැනි විද්‍යුත්-වාණිජ්‍ය මෙවලම්, දත්ත කළමනාකරණය සහ විද්‍යුත්-වාණිජ්‍ය මත පදනම් නිෂ්පාදන හා වෙළඳ කටයුතු සඳහා රජයේ හා පුද්ගලික අංශයේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම වැනි රටේ විද්‍යුත්-වාණිජ්‍ය සූදානම තක්සේරු කිරීම සහ පවත්නා පරතර හඳුනාගැනීම වේ. ශ්‍රී ලංකාවේ විද්‍යුත්-වාණිජ්‍ය සංවර්ධනය කරගැනීම සඳහා ආධාර දෙන සංවිධානවල හා ආයෝජකයන්ගේ අවශ්‍ය කෙරෙන අවධානය ආකර්ෂණය කරගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාව සම්බන්ධ මෙම ඇගයීම ප්‍රමුඛතා පදනමින් UNCTAD සංවිධානය සමඟ සහයෝගීතාවයෙන් යුතුව දියත් කිරීම සඳහා ලෝක බැංකුව මූලික සාකච්ඡාවේදී ඔවුන්ගේ එකඟතාවය පළ කරන ලදී.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව හා ශ්‍රී ලංකාවේ මහ බැංකුව වැනි රටේ ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නියුක්තව සිටින සම-නියෝජිතායතනවල සමීප සම්බන්ධීකරණයක් මෙම විද්‍යුත්-වාණිජ්‍ය සූදානම තක්සේරු කිරීමේ කාර්යයේ දී අවශ්‍ය කෙරේ.

### 3.3 ශක්‍යතා ගොඩනැංවීම සඳහා තාක්ෂණික සහාය

#### 3.3.1 ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රභවස්ථාන රීති සම්බන්ධ ජාතික වැඩමුළුව - 2018 ඔක්තෝම්බර් 30 වැනි දින සිට නොවැම්බර් මස 01 වන දින දක්වා කොළඹදී

ලෝක වෙළඳ සංවිධානය විසින් ලබාදුන් විශේෂඥ දැනුම සමඟින් වාණිජ දෙපාර්තමේන්තුව විසින් ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රභවස්ථාන රීති සම්බන්ධ ජාතික වැඩමුළුව 2018 ඔක්තෝම්බර් මස 30 වන දින සිට නොවැම්බර් මස 01 වන දින දක්වා කොළඹ දී සංවිධානය කරන ලදී. පුද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයෙන්ද සහභාගි වූ දෙපිරිසම මෙම පුහුණු වැඩසටහනේ ප්‍රතිලාභ ලබාගන්නා ලදී. මෙම වැඩමුළුව සඳහා ලෝක රේගු සංවිධානයේ සම්පත්දායකයන්ද සහභාගී වූ අතර, සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය ද ඇතුළුව ප්‍රභවස්ථාන රීති සම්බන්ධ ප්‍රායෝගික පැතිකඩ මෙහිදි මොවුන් විසින් ආවරණය කරන ලදී.

#### 3.3.2 යෝජිත වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ ජාතික මට්ටමේ වැඩමුළුව

ලෝක වෙළඳ සංවිධානයේ විවිධ ගිවිසුම්වල අන්තර්ගත වී ඇති විවිධ විශේෂ හා විවිධ වෙනස්කම් සහිත විධිවිධාන සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දැනුම පුළුල් කිරීමේ පවතින දැඩි අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් පසු, ජාතික මට්ටමේ අරමුණුගත ක්‍රියාකාරි වැඩමුළුවක් කොළඹ දී සංවිධානය කරන ලෙස යෝජනාවක් ලෝක වෙළඳ සංවිධානයේ ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදී. මෙම වැඩසටහන 2018 වර්ෂයේ අවසන් කාර්තුවේදී සංවිධානය කිරීමට මුලින් සාකච්ඡා කෙරුණ ද, සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි වූ බැවින් 2019 වර්ෂයේ මුල් භාගය දක්වා එය කල් දමන ලදී. මෙම පැහැදිලි අරමුණු ගත වැඩමුළුවේ දී ලෝක වෙළඳ සංවිධානයේ විවිධ ගිවිසුම්වල අන්තර්ගත වී ඇති විවිධ විශේෂ හා විවිධ වෙනස්කම් සහිත විධිවිධාන අවබෝධ කර ගැනීම සම්බන්ධව පවතින පරතරයන් හඳුනාගෙන කටයුතු කිරීමට අපේක්ෂිත අතර ලෝක වෙළඳාම සමඟ ඒකාබද්ධ වීමේ අපගේ ප්‍රයත්නවලදී එවැනි විධිවිධාන ඵලදායි අයුරින් යොදා ගනුයේ කෙසේ ද යන්නත් සලකා බලනු ඇත.

#### 3.3.3 ධීවර සහනාධාර ආශ්‍රිත එකඟතා සම්බන්ධයෙන් ආසියා හා ශාන්තිකර කලාපය සඳහා වූ කලාපීය වැඩමුළුව

සංවර්ධනය වෙමින් පවතින රටවල ධීවර අධිකාරීන් හා වෙළඳ එකඟතාකරුවන් අතර පවතින දැනුමේ පරතරය විසඳීමේ අරමුණින් ශක්‍යතා ගොඩනැංවීමේ කලාපීය මට්ටමේ වැඩමුළු පැවැත්විය යුතු බවට වූ යෝජනාවක් 2018 වර්ෂයේදී අවසන් වරට පැවත්වූ මහා මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාවේ තිබූ වැදගත්කම සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ලෝක වෙළඳ සංවිධානයේ ලේකම් කාර්යාලය විසින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලදී. ආසියාව සඳහා වන කලාපීය වැඩමුළුව කොළඹ දී පවත්වන ලෙස ශ්‍රී ලංකාව විසින් කරන ලද ඉල්ලීම ද ලේකම් කාර්යාලය විසින් පිළිගනු ලැබූ අතර, ලෝක වෙළඳ සංවිධානයේ මූල්‍ය ප්‍රතිපාදන හා ලෝක වෙළඳ සංවිධානය, ආහාර හා කෘෂිකර්ම සංවිධානය හා මෙම ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් ආයතනවල විශේෂඥ දැනුම සමඟින් මෙම කාර්යය 2019 මැයි මාසයේදී පැවැත්වීමට කටයුතු දියත් කර පවතී. ආසියානු කලාපයේ දියුණු වෙමින් පවතින රටවල නියෝජිතයන් කොළඹදී පැවැත්වෙන මෙම වැඩමුළුව සඳහා සහභාගී වීමට නියමිත අතර, විශේෂඥතා දැනුම සහිත තැනැත්තන්ගේ පැමිණීමේ වාසිය ලබා ගනිමින් ශ්‍රී ලංකාවට සත්කාරක රාජ්‍යය වශයෙන් වැඩදායි රැස්වීම් සංවිධානය කර ගැනීමට හැකිවනු ඇත.

#### 3.3.4 ලෝක වෙළඳ සංවිධානයේ අනෙකුත් තාක්ෂණික සහාය වැඩසටහන් සඳහා සහභාගිත්වය

ජිනීවා හි පිහිටි ලෝක වෙළඳ සංවිධානය හා අනෙකුත් ජාත්‍යන්තර ආර්ථික සංවිධානවල අනුග්‍රහය යටතේ පැවැත්වූ තාක්ෂණික සහාය වැඩසටහන් 16ක් සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් 21 දෙනෙකු 2018 වර්ෂය තුළ දී සහභාගී වී ඇත.

කෘෂිකර්මය, බුද්ධිමය දේපළ, සේවා වල වෙළඳාම, වෙළඳ කටයුතු හා පරිසරය, සනීපාරක්ෂක හා ශාක සනීපාරක්ෂක කටයුතු සම්බන්ධ ගිවිසුම්, රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු, ගෝලීය අගය දාම යනාදී වශයෙන් ලෝක වෙළඳ සංවිධානය හා අදාළ තාක්ෂණික කරුණු සේම ලෝක වෙළඳ සංවිධානය හා සම්බන්ධ සියලුම තාක්ෂණික කරුණු ආවරණය කෙරෙන වෙළඳ ප්‍රතිපත්ති පාඨමාලාව මෙම තාක්ෂණික සහාය වැඩසටහන් යටතේ ආවරණය කළ මාතෘකා අතර වේ.

**3.4 වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) සමඟ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය:**

වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය විසින් ලෝක ආයෝජන සමුළුවේ 10 වෙනි සැමරුම ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී (Palais des Nations) 2018 ඔක්තෝම්බර් 22 සිට 26 දක්වා පවත්වන ලදී. මෙම සමුළුව සඳහා 6,000කට අධික පිරිසක් රටවල් 186කින් සහභාගී වූ අතර, මීට රාජ්‍ය නායකයන් 11 දෙනෙකු, අමාත්‍යවරු 55 දෙනෙකු, ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනවල ප්‍රධානින් සහ බහුජාතික සමාගම් හා කොටස් වෙළඳ පොළ වලින් 1,700 කට අධික පුද්ගලික අංශයේ නියෝජිතයන් සහභාගී විය. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ ගරු අමාත්‍යවරයා මෙම සමුළුව සඳහා සහභාගී වීමට නියමිතව සිටි අතර, සමුළුව අතර පැවැත්වීමට නියමිතව තිබූ ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් සම්බන්ධ ඉහළ පෙළේ සම්මන්ත්‍රණයක සම-සභාපතිත්වයද දැරීමට නියමිත විය. එසේ වුව ද, ගරු අමාත්‍යවරයාගේ සංචාරය අවලංගු විය. ඒ අනුව, නීතිපති ගරු.ජයන්ත ජයසූරිය මහතා එකී ඉහළ පෙළේ සම්මන්ත්‍රණයක සම-සභාපතිත්වය දැරූ අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සමඟ ආයෝජන සමුළුව සඳහා සහභාගි විය.

2018 ජූලි මස පැවති තරඟකාරි නීතිය හා ප්‍රතිපත්තිය හා සම්බන්ධ අන්තර් රාජ්‍ය විශේෂඥ කණ්ඩායමේ 17 වැනි සැසිවාරයේදී, තරඟකාරී අධිකාරිවල ජාත්‍යන්තර සහයෝගය සම්බන්ධිත මෙවලමක් දියුණුකිරීම සඳහා රුසියානු සමූහාණ්ඩුව විසින් ඉදිරිපත් කළ යෝජනාව සඳහා ශ්‍රී ලංකාවද සිය සහයෝගය ලබා දෙන ලදී.

**3.5 ශ්‍රී ලංකාව තුළ ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන බදු සහ ආරක්ෂණ පියවර සම්බන්ධිත නීති පැනවීම**

පාර්ශවකරුවන්ගේ හා විශේෂඥ ආයතනවල උපදේශකත්වය ලබා ගැනීමේ දිර්ඝ කාලීන ක්‍රියාවලියකින් අනතුරුව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් අදාළ අනෙකුත් ආයතනවල ද සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ පිළියම් නීති සකස් කිරිමේ කටයුතු 2018 වර්ෂයේදී අවසන් කරන ලදී. ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ පිළියම් නීති ඇතුළත් නීති පනත් 02ක්, එනම් ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත ආරක්ෂණ පියවර පනත ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තු මාසයේදී අනුමත කරන ලද අතර එකී පනත් 2018 මාර්තු මස 23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. එම පනත් සම්මත කිරීම මඟින්, ලෝක වෙළඳ සංවිධානයේ මෙවැනි වෙළඳ ප්‍රතිකර්ම නීති සතු අනෙකුත් බහුතර සාමාජික රටවල් අතරට ශ්‍රී ලංකාව ද එකතු වනු ඇත.

ශ්‍රී ලංකාව තුළ ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රධාන කේන්ද්‍රීය ආයතනය වශයෙන් සැලකෙන ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුව, මෙම වෙළඳ ප්‍රතිකර්ම නීති මෙරට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එකී කාර්යය සඳහාම වෙන්වූ වෙළඳ ප්‍රතිකර්ම ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ පිහිටුවනු ලබන අතර, වෙළඳ පාර්ශවකරුවන් විසින් සිදුකරන අසාධාරණ වෙළඳ කටයුතු සම්බන්ධයෙන් විමර්ශන පැවැත්විම, පිළියම් පියවර සම්බන්ධ නිර්දේශ ලබාදීමේ වගකීම මෙයට පවරා ඇත. එකී කාර්යය සඳහාම වෙන්වූ මෙම වෙළඳ ප්‍රතිකර්ම ඒකකය ආර්ථික විද්‍යාඥයකුගෙන්, නීති නිලධාරීවරයෙකුගෙන් හා වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරී කණ්ඩායමකින් සමන්විත වේ.

නව නීති මඟින් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස මෙම ඒකකයේ කාර්ය මණ්ඩලය වෙත වෙළඳ පිළියම් සම්බන්ධ සියලුම අංශ ආවරණය වන පරිපූර්ණ පුහුණුවක් ලබාදීම හඳුනාගෙන ඇත. තවද මෙම නීති සාර්ථක අයුරින් ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය කරන තවත් වැදගත් කරුණක් වනුයේ මෙම වෙළඳ පිළියම් භාවිතා කළ හැක්කේ කුමන අවස්ථාවලදී ද යන්න සම්බන්ධයෙන් ව්‍යාපාරික ප්‍රජාව හා අනෙකුත් සහාය ආයතන තුළ පවතින සාමාන්‍ය අවබෝධයයි. වාණිජ දෙපාර්තමේන්තුව විසින් වාණිජ මණ්ඩල හරහා අලුතින් පැනවූ නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. එසේම වෙළඳ ප්‍රතිකර්ම ඒකකයේ නිලධාරීන් සඳහා වඩාත් අවශ්‍ය කෙරෙන පරිපූර්ණ තාක්ෂණික දැනුම සහ පුද්ගලික අංශයේ සහභාගීවූවන් සඳහා වෙළඳ ප්‍රතිකර්ම මෙවලම් ක්‍රියාත්මක කිරීම හා භාවිතා කිරීම සම්බන්ධයෙන් මනා ව්‍යුහගත තාක්ෂණික පුහුණුවක් දෙපාර්තමේන්තුව විසින් ආධාර ප්‍රදාන ආයතනවල සහයෝගීතාවයෙන් සංවිධානය කරන ලදී.

### 3.6 සහනාධාර සහ ප්‍රතිතෝලන බදු (ප්‍රතිතෝලන බදු අභියාචනා)

මඩ, වැලි හෝ ගල් පොළොවල් මත වැඩි සර්ෂණයක් ලබාදෙන ආකාරයට නිමවන ඕෆ්-ද-රෝඩ් ටයර් ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයන් සඳහා රජය මඟින් ලබා දෙන සහනාධාර මඟින් එකී නිෂ්පාදකයන් වාසි ලබන බවට සහ ඇමරිකා එක්සත් ජනපදයේ දේශීය රබර් කර්මාන්තයට එම සහනාධාර ලැබූ ආනයන මඟින් හානියක් වන බවටත් චෝදනා නගමින් ඇමරිකා එක්සත් ජනපද කර්මාන්තය විසින් ඇමරිකා එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ (USDOC) හා ඇමරිකා එක්සත් ජනපද ජාත්‍යන්තර වෙළඳ කොමිසමේ (USITC) ගොනුකළ ප්‍රතිතෝලන බදු පෙත්සම මත පදනම්ව, ඇමරිකා එක්සත් ජනපදයට ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන එම ඕෆ්-ද-රෝඩ් ටයර් සඳහා ප්‍රතිතෝලන බද්දක් පැනවීමේ අරමුණින් ඇමරිකා එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව විසින් සහනාධාර හා ප්‍රතිතෝලන බදු පිළිබඳ විමර්ශනයක් ආරම්භ කරන ලදී.

එම විමර්ශනයෙන් අනතුරුව, ඇ.එ.ජ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිතෝලන බදු පිළිබඳ විමර්ශනයේ අසාධාරණයට ලක්වූවන් සඳහා හිතකර වූ සිය අවසාන තීන්දුව 2017 ජනවාරි මස 04 වන දින ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකාවෙන් එරටට ආනයනය කරන ඕෆ්-ද-රෝඩ් ටයර් සඳහා 2.18%ක ප්‍රතිතෝලන බද්දක් පනවන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ එම බලපෑමට ලක් වූ අපනයනකරු විසින් ඇ.එ.ජ. වාණිජ දෙපාර්තමේන්තුවට සහ ඇ.එ.ජ. ජාත්‍යන්තර වෙළඳ කොමිසම වෙත පෙත්සම්කරුගේ චෝදනා බිඳ හෙළිමින් සැල කිරීම් ගණනාවක් විමර්ශන අදියරේදී ඉදිරිපත් කරන ලදී. 2.18%ක ප්‍රතිතෝලන බද්දක් පැනවීමෙන් අනතුරුව, ඇ.එ.ජ. වාණිජ දෙපාර්තමේන්තුවේ තීරණය ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධ ඇමරිකා එක්සත් ජනපදය අධිකරණයේදී අභියෝගයට ලක් කිරීම සඳහා අනෙකුත් රේඛීය නියෝජිතායතනවල හා දේශීය සමාගමේ සහයෝගයෙන් වාණිජ දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. අභියාචනා ක්‍රියාවලිය තුළ දී ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ඵලදායි මැදිහත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ සහනාධාර යෝජනා ක්‍රම වලින් එකකට අදාළ 0.95%ක ප්‍රතිතෝලන බද්ද ඉවත් කරන ලෙස 2018 ජූලි මස 11 වන දිනැතිව ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධ ඇමරිකා එක්සත් ජනපදය අධිකරණය විසින් නියෝග කරන ලදී. මෙම ඉවත් කිරීමත් සමඟ, ඇ.එ.ජ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවෙන් එරටට ආනයනය කරන ඕෆ්-ද-රෝඩ් ටයර් සඳහා පනවන ලද සමස්ත ප්‍රතිතෝලන බද්දක් අවම ප්‍රවේශ 2% ට වඩා අඩු වීමෙන් ලෝක වෙළඳ සංවිධානයේ ගිවිසුම් ප්‍රකාරව සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පැනවිය ප්‍රතිතෝලන බද්දට අනුකූල විය. මෙමඟින් ශ්‍රී ලංකාවෙන් ඇමරිකා එක්සත් ජනපදයට අපයනය කරන ඕෆ්-ද-රෝඩ් ටයර් සඳහා 2.18%ක ප්‍රතිතෝලන බද්දක් පැනවීම අහෝසි වීමේ මාර්ගය උදා විය. එසේ වුවද, එම තීරණයට එරෙහිව ඇ.එ.ජ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. මෙරට වාණිජ දෙපාර්තමේන්තුව අදාළ අනෙකුත් ආයතන සමඟ සහයෝගිතාවයෙන් අභියාචන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය පරිදි සැලකිරීම් සිදුකරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ අභියාචනය පසුව නිෂ්ප්‍රභ විය.

### 3.7 වෙළඳ ප්‍රතිකර්ම ඒකකය

2018 මාර්තු මාසයේදී පනවන ලද ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ සහ ආරක්ෂණ පියවර පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් වෙළඳ ප්‍රතිකර්ම ඒකකයක් ස්ථාපනය කරන ලදී. ප්‍රපාතනය කළ භාණ්ඩ, සහනාධාර දෙනු ලැබූ භාණ්ඩ, ආනයන ඉහළ යාමක් සම්බන්ධ චෝදනා සඳහා විමර්ශන සිදු කිරීමේ සහ එවැනි ක්‍රියාවන්හි ප්‍රතිඵල වලට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමේ බලය මෙම පනත් ද්විත්වය මඟින්ම වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් අතුරින් නිලධාරීන් 8 දෙනෙකුගෙන් මෙම වෙළඳ ප්‍රතිකර්ම ඒකකය සමන්විත වේ. තවද බඳවා ගැනීමෙන් අනතුරුව ස්ථිරවම මෙම ඒකකයට අනුයුක්ත කරන විශේෂ නිලධාරින් දෙදෙනෙකුද එනම්, නීති නිලධාරීයෙකු හා ආර්ථික විද්‍යාඥයෙකු ද මෙම ඒකකයට අයත් වේ.

මෙම ඒකකය ස්ථාපනය කිරීමට අදාළව වාණිජ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යය සිදු කරනු ලැබේ;

1) නීති නිලධාරි හා ආර්ථික විශේෂඥ බඳවා ගැනීම
2) පනතට අදාළ රෙගුලාසි සැදීමේ කටයුතු නිම කිරීම

3) විමර්ශනවලට අදාළ ලේඛනවල කටයුතු නිම කිරීම
4) ගණනය කිරීම්, දත්ත රැස් කිරීම, නෛතික අවශ්‍යතා ඇතුළුව විමර්ශන සිදුකිරීමේ කටයුතු සම්බන්ධව ඒකකයේ නිලධාරීන් පුහුණු කිරීම
5) මෙම පනත් භාවිතා කිරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය සඳහා පුහුණු ලබාදීම

මෙයට අදාළ තවත් කාර්යයක් වනුයේ වරණීය නොවන ප්‍රභවස්ථාන රීති රාමුවක් පිළියෙල කිරීමයි. මෙය භාණ්ඩවල ප්‍රභවස්ථානය හඳුනාගැනීම සඳහා අවශ්‍ය කෙරන අතර ඊට එරෙහි අවස්ථාවලදී ඉහත පනත් හරහා පියවර ගත හැකි වේ. වර්තමානයේදී ශ්‍රී ලංකාව සතුව ප්‍රභවස්ථාන රීති රාමුවක් නොමැත. එනිසා, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රේගුව හා අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව එවැනි ක්‍රියාපටිපාටියක් ලබන වසර ඇතුළතදී සකස් කිරීම සඳහා කටයුතු කරමින් සිටී.

### 3.8 ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය (SLTIP)

ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය යනු ශ්‍රී ලංකාව තුළට හා ඉවතට සිදුවන ආනයන හා අපනයන කටයුතු වලට අදාළ සියලු තොරතුරු ලබාගත හැකි එක් ස්ථානයකි. ආනයන/අපනයන ක්‍රියාවලියේ නියුක්ත සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නියෝජිතායතන වෙනුවෙන් මෙම වෙළඳ තොරතුරු ද්වාරය පවත්වා ගෙන යනු ලබනුයේ වාණිජ දෙපාර්තමේන්තුවයි. මෙම තොරතුරු ද්වාරයේදී, ස්වකීය ගනුදෙනු සිදුකිරීම සඳහා සම්පූර්ණ කළ යුතු සියලුම නීතිමය අවශ්‍යතා පිළිබඳ තොරතුරු වෙළඳුන් හට ලබාගත හැකි වේ. මෙම නීතිමය අවශ්‍යතා සඳහා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නියෝජිතායතන කිහිපයක් සම්බන්ධ වේ.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම කාර්යය සඳහාම නිලධාරීන් අට දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් පත් කර ඇත. මෙම තොරතුරු ද්වාරය සඳහා තොරතුරු සම්පාදනය කරන සියලුම පාර්ශවකරුවන්ගෙන් අදාළ තොරතුරු පිළිබඳ 100%ක තහවුරු කිරීමක් ඔවුන් වෙත ලැබේ. තවද පාර්ශවකරුවන්ගෙන් අඛණ්ඩව SLTIP වෙත තොරතුරු ලබාගැනීම තහවුරු කර ගැනීම සඳහා ඒ වෙත තොරතුරු සපයන ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්ද අත්සන් කර ඇත.

මධ්‍යම හා වයඹ පළාත්වල වාණිජ හා කර්මාන්ත මණ්ඩල සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සමඟ සහයෝගිතාවයෙන් සහ යුරෝපා සංගමයේ මූල්‍ය ප්‍රතිපාදන මත, වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2018 වර්ෂයේ අවසන් කාර්තුවේ දී පවත්වා ඇත. තවද මෙරට නාගරික හා ප්‍රාදේශීය වශයෙන් ස්ථානගත අපනයන කරුන් අතර SLTIP හි වාසි පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් වාණිජ මණ්ඩල සමඟ සහයෝගීතාවයෙන් වැඩමුළු 03ක් කොළඹ දී සංවිධානය කරන ලදී.

2018 දෙසැම්බර් මාසයේදී වාණිජ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් තාක්ෂණික සහයෝගිතා සැසිවාර කිහිපයක් පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ දැනට ක්‍රියාත්මක SLTIP වෙබ් අඩවියේ පරිශීලක-මිත්‍රශීලී භාවය පියවරෙන් පියවර යන ක්‍රියාවලියක් ඔස්සේ විස්තර වශයෙන් සකස් කර වැඩි දියුණු කිරීමයි.

## 4. ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගිතාවය

### 4.1 ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2000 වර්ෂයේ සිට බලාත්මක ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) මඟින් ඉන්දියානු වෙළඳ පොළ වෙත ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා සුවිශේෂී දායකත්වයක් අඛණ්ඩව ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවට සිදුකළ අපනයනවල සමස්ත වටිනාකම 2017 වර්ෂයේ වාර්තා වූ ඇ.ඩො. මිලියන 689.48 සිට 2018 වර්ෂයේදී ඇ.ඩො. මිලියන 768.71 දක්වා වාර්ෂිකව 11% කින් වැඩි වී ඇත. ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සිදුකළ අපනයන වලින් 63% කට ආසන්න ප්‍රමාණයක් ISFTA සහන යටතේ සිදුකර ඇත. ඒ අනුව, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු 47% ක වර්ධනයක් වාර්තා කරමින්, ශ්‍රී ලංකාව විසින් ISFTA යටතේ ඉන්දියාවට ඇ.ඩො. මිලියන 481 ක වටිනාකමකින් යුක්ත භාණ්ඩ 2018 වර්ෂයේදී අපනයනය කර ඇත.

ගෘහ භාණ්ඩ, එම්ඩීඑෆ් බෝඩ්, පරිවෘත කොපර් වයර් හා කේබල්, බෝතල් කූලර් යන්ත්‍ර, විදුලි උපකරණ හා උපකරණ කොටස්, ඔප දමන ලද කිරිගරුඬ, ඇඟළුම්, වීදුරු බෝතල්, රබර් අත්වැසුම්, වායව ටයර්, බයිසිකල්, කොකෝවා නිෂ්පාදන, පිරිසැකසුම් කළ මස් නිෂ්පාදන, සෙරමික් මේස භාණ්ඩ හා ටයිල්, විවිධ ආහාර සැකසුම්, කුළුබඩු, සත්ත්ව ආහාර ආදිය ISFTA සහන යටතේ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයන කළ ද්‍රව්‍ය අතර වේ.

ඉන්දු- ශ්‍රී ලංකා භාණ්ඩ වෙළදාමට බාධා ඇති කරවන ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ආශ්‍රිත ගැටලු නිරාකරණය සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අදාළ දේශීය පාර්ශවකරුවන් සේම ඊට අදාළ ඉන්දීය පාර්ශවකරුවන් සමඟ සෑම විටම සම්බන්ධ වනු ලැබේ. මේ සම්බන්ධයෙන් සැලකූ විට අවධානය යොමු කරන ප්‍රධාන ගැටලු වනුයේ ඇඟළුම් හා කළු ගම්මිරිස් වැනි නිෂ්පාදන සඳහා ඉන්දියාව විසින් පනවනු ලබන ප්‍රමාණාත්මක සීමා කිරීම් ඉවත් කර ගැනීම, තේ අපනයන සම්බන්ධ රේගු නිෂ්කාශන කටයුතු හා සාම්පල පරීක්ෂා කිරීමේ පරිපාටි, අධික ලෙස අයකරනු ලබන ලේබන ගාස්තු හා අධික ප්‍රමාද වීම්. ශ්‍රී ලංකාවේ නැව් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා ඉන්දීය රජයේ ප්‍රසම්පාදන ටෙන්ඩර් ලබාගැනීම තහවුරු කර ගැනීම් සහ සමහර තීරුබදු නොවන පියවර ආදිය වේ.

ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රජාව වෙනුවෙන් ඉන්දියාව විසින් මෑතකදී හඳුන්වා දුන් භාණ්ඩ හා සේවා බද්ද (GST) සම්බන්ධයෙන් වූ සම්මන්ත්‍රණයක් පැවැත්වීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ සමීප සහයෝගිතාවයෙන් යුතුව පහසුකම් සලසන ලදී. 2018 මාර්තු මස 23 වන දින කොළඹ දී මෙම සම්මන්ත්‍රණය පවත්වන ලද්දේ ඉන්දියාවේ තීරුබදු හා රේගු මධ්‍යම මණ්ඩලයේ භාණ්ඩ හා සේවා බදු අංශය විසිනි. මීට පෙර ඉන්දියානු වෙළඳ පොලේදී ශ්‍රී ලාංකික අපනයනකරුවන් මුහුණ දුන් ප්‍රධානතම බාධාවක් වූයේ ඉන්දියාවේ මධ්‍යම රජය මට්ටමෙන් සහ ප්‍රාන්ත රාජ්‍ය මට්ටමෙන් වෙනස් බදු වර්ග රාශියක් අයකර ගැනීමයි. නමුත්, මෙම භාණ්ඩ හා සේවා බද්ද (GST) හඳුන්වාදීමත් සමඟ, ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට සිදුකරන අපනයන සඳහා එකී ගැටලුවලින් බොහොමයක් ඉදිරියේදී බල නොපානු ඇත.

### 4.2 පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2005 වර්ෂයේ සිට බලාත්මක පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) මඟින් ද දෙරට අතර සිදුකරන ද්වීපාර්ශ්වික වෙළඳ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා දායකත්වයක් ලැබී ඇත. 2018 වර්ෂයේදී පකිස්තානයට සිදුකරන ලද අපනයනවල වටිනාකම ඇ.ඩො.මිලියන 75.94ක් වූ අතර එයින් ඇ.ඩො.මිලියන 50.72 ක අපනයන සිදුකර ඇත්තේ PSFTA යටතේය. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ PSFTA යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකළ අපනයන අතර ප්‍රධාන නිෂ්පාදන වනුයේ පොල්, බුලත් කොළ, දිසිදි පොල්, එම්ඩීඑෆ් බෝඩ් සහ කළු තේ වන අතර එකී කාල සීමාව තුළම මෙම ගිවිසුම යටතේ සිදුකළ ආනයන වනුයේ තිරිඟු පිටි, මස්ලින්, සහල්, ඉපිලි විදුරු, පැඟිරි කුලයේ පලතුරු, වානේ ටියුබ් ආදිය වේ.

### 4.3 ඇමරිකා එක්සත් ජනපදය සමඟ ඇතිකර ගත් වෙළඳ හා ආයෝජන පහසුකම් සැලසීමේ ගිවිසුම (TIFA)

ඇමරිකා එක්සත් ජනපද - ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම (TIFA) යටතේ එහි ඒකාබද්ධ සභා රැස්වීමේ 13 වන සැසිය 2018 දෙසැම්බර් මස ශ්‍රී ලංකාවේ දි පැවැත්වීමට නියමිතව තිබුණි. නමුත්, නොවැළැක්විය හැකි හේතූන් මත, ඇමරිකානු පාර්ශවයෙන් මෙම ඒකාබද්ධ සභා රැස්වීම 2019 වර්ෂයේ පළමු කාර්තුවේ සංවිධානය කරන ලෙස ඉල්ලීමක් සිදුකර ඇත.

ඇමරිකා එක්සත් ජනපදයේ වෙළඳ ප්‍රතිපත්තියේ සිදුවූ වෙනස් වීමත් සමඟ, ඇමරිකා එක්සත් ජනපද නියෝජිත කාර්යාලය විසින් (USTR) විසින් ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළඳ කටයුතු හා ආයෝජන වැඩි දියුණු කිරීම සඳහා ඒකාබද්ධ සභා රැස්වීමේ 12 වන සැසිවාරයේ දී සම්මත කරගත් ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අපේක්ෂාවෙන් පසු වේ. ඒ අනුව, ඇමරිකා එක්සත් ජනපද නියෝජිත කාර්යාලය විසින් 13 වන සැසි වාරය සඳහා දින නියම කිරීමට ප්‍රථම ප්‍රධාන ක්ෂේත්‍ර 06 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මතය විමසා ඇත.

පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ මතය පැහැදිලි කරමින් වාර්තාවක් සපයා ඇත.

i. ලෝක වෙළඳ සංවිධානයේ තොරතුරු තාක්ෂණ ගිවිසුමේ (**ITA**) සාමාජිකත්වය ලබා ගැනීම
ii. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම (**TFA**) ක්‍රියාත්මක කිරීම

iii. රේගු බදු නොවන ආනයන බදු හා සෙස් තර්කාපනය කිරීම
iv. බුද්ධිමය දේපළ අයිතිවාසිකම් **(IPRs)** බලාත්මක කිරීම හා නවෝත්පාදන
v. වෙළඳාම පහසු කිරිමට අදාළ කාර්යය

**4.4 සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම**

වෙළඳ ප්‍රතිකර්ම, භාණ්ඩ හා සේවා වැනි විෂය ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිය තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දී ඇත.

**4.5 ඒකාබද්ධ කමිටු:**

**4.5.1 වෙළඳාම සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ කුවේට් - ශ්‍රී ලංකා ඒකාබද්ධ අමාත්‍ය කමිටුව**

වෙළඳාම සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ කුවේට් - ශ්‍රී ලංකා ඒකාබද්ධ අමාත්‍ය කමිටුවේ (JMCTT) 2වන සැසිවාරය 2018 ඔක්තෝම්බර් 8 සිට 11 දක්වා කුවේට්හිදී පවත්වන ලදී.

විශේෂයෙන් වෙළඳාම හා ආයෝජන යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කරගැනිම සම්බන්ධයෙන් වූ වැදගත් අවසන් තීරණ කිහිපයකට දෙරට විසින් එකඟතාවයකට පැමිණෙන ලදි. ඒ අනුව, කුවේට් රාජ්‍යයේ ආයෝජන ප්‍රවර්ධන වැඩමුළු සංවිධානය කිරිමේ හා තෝරාගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවිමේ හැකියාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කරුණු සලකා බලනු ඇත.

කුවේට්හි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ශ්‍රී ලංකාව විසින් ආයෝජන යෝජනා ඉදිරිපත් කරනු ඇත. විභව්‍ය කුවේට් ආයෝජකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහා ද තීරණය කරන ලදී. දෙරටේම ව්‍යාපාරික ප්‍රජාවන් අතර පවතින සබඳතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ජාතික වාණිජ මණ්ඩලය (NCC) හා කුවේට්හි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (KCCI) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමටද එකඟවන ලදී. මෙම අවබෝධතා ගිවිසුමේ කෙටුම්පතක් දැනටමත් කුවේට්හි අදාළ පාර්ශවට වෙත ඉදිරිපත් කර ඇත. වෙළඳාම සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ කුවේට් - ශ්‍රී ලංකා ඒකාබද්ධ අමාත්‍ය කමිටුවේ 2වන සැසිවාරයේදී එළඹී තීරණ කඩිනමින් ක්‍රියාත්මක කරවීම තහවුරු කිරීම සඳහා, 2018 ඔක්තෝම්බර් මාසයේදී අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පසු-විපරම් රැස්වීමක් ද පවත්වන ලදී.

**4.5.2 ආර්ථික සහයෝගිතාවය පිළිබඳ ශ්‍රී ලංකා-ඉරාන ඒකාබද්ධ කමිටුව**

ආර්ථික සහයෝගිතාවය පිළිබඳ ඒකාබද්ධ කොමිෂන් සභාවේ (JCEC) 11 වන සැසිවාරයට අදාළ පසු විපරම් කමිටු රැස්වීමක් 2018 පෙබරවාරි මස 07 වන හා 08 වන දිනවලදී කොළඹ දී පවත්වන ලදි. මෙම රැස්වීමේදී දෙපාර්ශවයම විසින් 11 වන සැසිවාරය යටතේ ආරම්භ කළ කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කළ අතර, මෙතෙක් ක්‍රියාත්මක නොවූ තීරණ සම්බන්ධ කටයුතු ද 12 වැනි ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීමට ප්‍රථම ක්‍රියාත්මක කිරිමට එකඟ විය. දෙරට අතර වාණිජ ගනුදෙනු සිදු කිරීම සඳහා විධිමත් බැංකු හා ගෙවීම් පද්ධතියක් නොපැවතීම මෙම රැස්වීමේදී අවධානයට යොමු වූ ප්‍රධානතම ගැටලුවකි. මෙය වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානයට යොමු කර ඇත.

මෙම පසුවිපරම් කමිටුවේදී අවධානය යොමු කළ කාර්යයන් අතිගරු ජනාධිපතිතුමාගේ 2018 මැයි 13 වන දින ටෙහරාන් සංචාරය සඳහා ද මූලික වූ කරුණක් වූ අතර, එහිදී දෙරට අතර අවබෝධතා ගිවිසුම් 05ක් අත්සන් කරන ලදී.

ඒකාබද්ධ කොමිෂන් කමිටුවේ 12 වන සැසිය මුලින් 2018 අගෝස්තු මස 27 හා 28 යන දිනවල පැවැත්වීමට නියමිතව තිබුණද පසුව එය 2019 වර්ෂය දක්වා කල් දමන ලදී.

## 5. කලාපීය ආර්ථික සහයෝගීතාවය

ශ්‍රී ලංකාව විසින් ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය සඳහා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC) හා ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානය (IORA) වැනි එහි කලාපීය වෙළඳ හා ආර්ථික ගිවිසුම් වලදී තවදුරටත් ප්‍රධාන භූමිකාවක් සිදු කරන ලදී.

### 5.1 දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)

කලාපීය සහයෝගීතාවය සඳහා වන දකුණු ආසියානු සංවිධානය (SAARC) 1985 වර්ෂයේදී ආරම්භ කරන ලදී. සාක් සංවිධානයේ සාමාජික රාජ්‍ය වනුයේ ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය හා ශ්‍රී ලංකාව වේ. එහි ආරම්භ අවස්ථාවේදී සාක් සංවිධානය වැඩි මතභේදයනට තුඩු නොදෙන සෞඛ්‍ය, ජනගහණය, කාලගුණය, විදුලි සංදේශ, ක්‍රීඩා, සංස්කෘතික වැනි ක්ෂේත්‍රවලට පමණක් සීමා විය. 1988 දෙසැම්බර් මාසයේදී ඉස්ලාම්බාද් නගරයේ පැවති 4 වැනි සාක් සමුළුවේදී සාක් රාමුව තුළ නිශ්චිත හා ප්‍රතිඵල පාදක ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. ඒ අනුව, 1991 දෙසැම්බර් මස කොළඹ දී පැවති හයවන සාක් සමුළුවේදී සාක් රටවල් අතර වෙළඳාම ලිබරල්කරණය කිරීමේ අදහස ශ්‍රී ලංකාව විසින් පළමුවරට සාකච්ඡාවට ඉදිරිපත් කරන ලදි. දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1993 අප්‍රේල් මස 11 වන දින අත්සන් කරන ලද අතර 1995 දෙසැම්බර් මස 07 වන දින සිට එය බලාත්මක වන ලදී. සාක් කලාපය තුළ සහන හුවමාරු කර ගැනීම ඔස්සේ අන්‍යෝන්‍ය වෙළඳාම හා ආර්ථික සහයෝගිතාවය ප්‍රවර්ධනය හා තහවුරු කරගැනීමේ සමාජික රටවල අභිලාෂය මෙම ගිවිසුම මඟින් පෙන්නුම් කරන ලදී. දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපයක් කරා පරිවර්තනය වීමේ ප්‍රථම පියවර වශයෙන් සප්තා ගිවිසුම මූලිකව සැලකූ අතර ඉන් අනතුරුව රේගු ඒකබද්ධතාවයකට කරා යොමු වීම අපේක්ෂා කරන ලදී. එබැවින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය (SAFTA) මඟින් සප්තා ගිවිසුම ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිස්ථාපනය කිරීමට නියමිතය. එනිසා, සප්තා යටතේ පවතින තීරුබදු වරණ ක්‍රමිකව අඩුවෙමින් පවතී.

සප්තා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2017 හා 2018 වර්ෂ සඳහා පිළිවෙලින් ඇමරිකන් ඩොලර් මිලියන 4.49 ක් හා ඇමරිකන් ඩොලර් මිලියන 3.52 ක් විය. සප්තා ගිවිසුම යටතේ අපනයන කරන ප්‍රධානතම අයිතමය සෙලීය නොවන රබර් ෂීට් වන අතර දෙවන ප්‍රධාන අයිතමය වනුයේ වියන රෙදිපිළිය. 2018 වර්ෂය තුළදී වාණිජ දෙපාර්තමේන්තුව විසින් සප්තා ගිවිසුම යටතේ ප්‍රභවස්ථාන සහතික 241 ක් නිකුත් කර ඇත.

### 5.2 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 2004 ජනවාරි මාසයේදී අත්සන් කරන ලද අතර 2006 ජනවාරි මාසයේ සිට එය බලාත්මක විය. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අරමුණ වූයේ 1995 වර්ෂයේදී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමෙන් (SAPTA) ඇරඹි වරණීය වෙළඳාම ප්‍රවර්ධනය ඔස්සේ කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය ගොඩ නැංවීමේ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීම වේ.

දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) අභිභවමින් ක්‍රියාත්මක වරණීයව වෙළඳාම ප්‍රවර්ධනය කිරීම ඔස්සේ කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය තවදුරටත් වැඩිදියුණු වීම අපේක්ෂා කෙරෙන දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) අත්සන් කරනු ලැබුවේ ඉස්ලාම්බාද් අගනුවර පැවති 12 වන සාක් සමුළුව පැවැත්වෙන අතරවාරයේ 2004 ජනවාරි මාසයේ දීය. සප්තා ගිවිසුම යටතේ පැවති තීරුබදු සහන අඩුවූ අතර, එය සෆ්තා මඟින් ප්‍රතිස්ථාපනය විය. නිදහස් වෙළඳ ප්‍රදේශයක් සහිත දකුණු ආසියානු කලාපීය ආර්ථික සංගමයක් (SAEU), රේගු සංගමයක්, පොදු වෙළඳ පොළක්, සහ පොදු ආර්ථික හා මුදල් සංගමයක් ඇති කරමින් කලාපයේ ආර්ථික ඒකාබද්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා සාක් සාමාජිකයෝ අපේක්ෂා කරති. මෙම ප්‍රයත්නය 2014 වර්ෂයේදී අවසන් වරට පැවති 18 වන සාක් සමුළුවේදී නැවත ශක්තිමත් විය.

**5.2.1 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරු බදු අඩු කිරීම් සහ සංවේදී ලැයිස්තු (I, II සහ III අදියර)**

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාව, පකිස්ථානය හා ශ්‍රී ලංකාව අවම සංවර්ධිත නොවන රටවල් ලෙසත් (NLDCs) ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, භූතානය, මාලදිවයින හා නේපාලය අවම සංවර්ධිත රටවල් ලෙසත් (LDCs) හඳුනාගෙන ඇත. සෆ්තා ගිවිසුමේ (නිෂේධ ලැයිස්තුවේ) ශ්‍රී ලංකා සංවේදී ලැයිස්තුවේ සය අංකිත මට්ටමේ ඇති නිෂ්පාදන සංඛ්‍යාව 1,065ක් වන අතර (H.S.2002 සංස්කරණය) ශ්‍රී ලංකාව විසින් සිය වෙළඳ ලිහිල්කරණ බැඳීම්, වෙළඳ ලිහිල්කරණ වැඩසටහනේ (TLP) පළමු අදියරේ දී 2015 නොවැම්බර් මස 21 වන දින සම්පූර්ණ කරන ලදී. වෙළඳ ලිහිල්කරණ වැඩසටහනේ දෙවන අදියර ද (සංවේදී ලැයිස්තුව අඩු කිරීම) සියලු සාමාජික රාජ්‍ය විසින් සාර්ථක අයුරින් එකඟතාවයකට පැමිණි ක්‍රියාත්මක කරන ලදී. මෙම අදියර යටතේ, සිය මුල් සංවේදී ලැයිස්තුවෙන් අවම වශයෙන් 20% ක අඩු කිරීමක් සිදු කිරීම සඳහා සාමාජිකයන් එකඟ වන ලදී. සෆ්තා ගිවිසුමේ III අදියර යටතේ සංවේදී ලැයිස්තු අඩු කිරීම සම්බන්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ තෙවන රැස්වීම 2015 ජූලි මස 06 වන දින ඉස්ලාම්බාද් වලදී පවත්වන ලදී. සෆ්තා ගිවිසුමේ III අදියර යටතේ සංවේදී ලැයිස්තු තව දුරටත් අඩු කිරීම සම්බන්ධ කරුණු සලකා බලන ලදී. ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, නේපාලය සහ පකිස්තානය යන සාමාජික රටවල නියෝජිතයන් සෆ්තා ගිවිසුම යටතේ සංවේදී ලැයිස්තු 20%කින් අඩුකිරීමට එකඟවිය. අවම සංවර්ධිත නොවන රටවල් සඳහා පමණක් ඉන්දියාව විසින් සංවේදී ලැයිස්තුවෙන් 20%ක් අඩු කරන ලද අතර මෙම රැස්වීමේදී සෆ්තා යටතේ සිය සංවේදී ලැයිස්තුව 10%කින් අඩු කිරීම සඳහා ශ්‍රී ලංකාව එකඟ වී ඇත.

2012 ජූනි මස 18 වන දින කත්මණ්ඩු නුවර සාක් මහ ලේකම් කාර්යාලයේදී පැවති රැස්වීම් වලදී හා 2015 ජූලි මස 04 වන දින සෆ්තා විශේෂඥ කමිටුවේ විශේෂ රැස්වීමේදී, ''දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ නිෂේධ ලැයිස්තුව අඩු කිරීම සඳහා වන විශේෂ යෝජනාව'' යන මැයෙන් සාමාජික රාජ්‍යයන් ස්ථිර හෝ තාවකාලික පදනම්වලින් සිය යෝජනා ඉදිරිපත් කරන ලදී.

**5.2.3 දකුණු ආසියානු ආර්ථික සංගමය (SAEU): කලාපීය ආර්ථික ඒකාබද්ධතා අධ්‍යයනය (II වන අදියර)**

2014 නොවැම්බර් මස 23 සිට 24 දක්වා කත්මණ්ඩු නුවර පැවති ස්ථාවර කමිටු 41 සැසිවාරය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ඇතිව අවසන් කළ කලාපීය ආර්ථික ඒකාබද්ධතා අධ්‍යයනය සැලකිල්ලට භාජනය කර අනුමත කරන ලදී. මැත කාලීන වශයෙන් පොදු බාහිර බදු (රේගු සංගමයේ පරිදි) හෝ පොදු මූල්‍ය ඒකකයන් (මූල්‍ය සංගමයේ පරිදි) කින් දකුණු ආසියානු ආර්ථික සංගමය සමන්විත විය යුතු බවට මෙම අධ්‍යයනය මඟින් අපේක්ෂා නොකළ බව අවධාරණය කළ යුතු වේ.

දකුණු ආසියානු ආර්ථික සංගමය ඉදිරියටත් ක්‍රියාත්මක වීම සඳහා මෙම අධ්‍යයනයේ අන්තර්ගත නිර්දේශ ප්‍රමුඛතාවය ලබා දී ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා වාණිජ හා මූල්‍ය අමාත්‍යාංශවල නියෝජිතවරුන්ගේ විශේෂ රැස්වීමක් 2015 මුල් කාර්තුවේදී පැවැත්වීමට ස්ථාවර කමිටුව විසින් නිර්දේශ කරන ලදී. තවද, කලාපීය ආර්ථික ඒකාබද්ධතා අධ්‍යනය සම්බන්ධයෙන් සාක්-ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ රැස්වීම් දෙකක් පවත්වන ලදී. පළමු රැස්වීම 2015 අප්‍රියෙල් 14 සිට 15 දක්වා ඉන්දියාවේ ගෝවේ නගරයේ ද, සාක්-ආසියානු සංවර්ධන බැංකුවේ දෙවන විශේෂ රැස්වීම 2016 ජනවාරි 27 සිට 28 දක්වා මාල දිවයිනයෙහි ද පවත්වන ලදී.

2015 ජූලි මස ඉස්ලාම්බාද් නගරයේ පැවති රැස්වීම් වලින් අනතුරුව, දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සෆ්තා) යටතේ විශේෂඥ කමිටුව රැස්වීම් නොපැවත් වූ අතර, කිසිදු ප්‍රගමන කාර්යයක් ද සිදු නොවිණි.

සාක් කලාපයේ ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන්, එනම් ඉන්දියාව හා පකිස්තානය සමඟ ඇති කරගනු ලැබූ නිදහස් වෙළඳ ගිවිසුම් ද්විත්වය යටතේ වෙළඳ කටයුතු සිදුවන බැවින් සෆ්තා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන වෙළඳාම ඉතා අවම මට්ටමේ පවතී.

**5.3 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)**

පෙර බැංකොක් ගිවිසුම වශයෙන් හැඳින්වූ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම, ආසියානු හා ශාන්තිකර කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාවේ (UN-ESCAP) මූලාරම්භයක් වශයෙන් 1975 වර්ෂයේ දී අත්සන් කරන ලදී. ආසියා ශාන්තිකර කලාපයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර පවතින පැරණිතම වරණීය වෙළඳ ගිවිසුම මෙයයි. අන්තර්කලාපීය වෙළඳ ව්‍යාප්තිය සඳහා දායක වන හා වෙළඳ භාණ්ඩ, සේවා, ආයෝජන හා වෙළඳාම සඳහා පහසුකම් සැලසීම ආවරණය කිරීම ඔස්සේ ආර්ථික

ඒකාබද්ධතාවය සඳහා මහ පාදන අන්‍යෝන්‍ය වාසිදායක වෙළඳ ලිහිල්කරණ පියවර අනුගමනය කිරීම ඔස්සේ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙන් අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව, බැංකොක් ගිවිසුමේ හා ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ ආරම්භක සාමාජිකයෙකි. දැනට මෙම ගිවිසුමේ වර්තමාන සහභාගිත්ව රටවල් වනුයේ බංග්ලාදේශය, චීනය, ඉන්දියාව, කොරියානු සමූහාණ්ඩුව, ලාඕසය හා ශ්‍රී ලංකාව වේ. මොංගෝලියාව විසින් වර්තමාන සහභාගිත්ව රටවල් සමඟ බදු සහන සම්බන්ධ ප්‍රවේශ එකඟතා සම්පූර්ණ කර ඇති අතර නුදුරේදීම මෙම ගිවිසුමේ 7 වන සාමාජිකත්ව රාජ්‍යය බවට පත් වනු ඇත.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ 4 වන වටයේ එකඟතාවල ප්‍රතිඵලයක් වූ ලේඛනය, එනම් එහි 2 වන සංශෝධනය 33%ක මධ්‍යයන වරණ අන්තයක් සමඟ නිෂ්පාදන 10,312ක් සඳහා පොදු බදු සහන ලබා දෙමින් 2018 ජූලි මස 01 වන දින සිට නිල වශයෙන් බලාත්මක වන ලදී. මීට අමතරව, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ සංවර්ධනය වෙමින් පවතින සාමාජික රාජ්‍ය වන චීනය, කොරියානු සමූහාණ්ඩුව හා ශ්‍රී ලංකාව විසින් එහි අවම සංවර්ධිත රාජ්‍ය වන බංග්ලාදේශය හා ලාඕසය වෙත 86%ක මධ්‍යයන වරණ අන්තයක් සමඟ නිෂ්පාදන 1,259ක් සහ 1,251ක් සඳහා පොදු බදු සහන ලබා දෙන ලදී. 2018.03.16 දිනැති අංක 2062/45 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ නිල නිවේදනයක් පළ කිරීම මඟින් ශ්‍රී ලංකාව විසින් ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ සිව්වව වටයේ දි සිදුකළ එකඟතාවයන් සම්බන්ධ බදු සහන බැඳීම් ක්‍රියාත්මක කර ඇත.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ස්ථාවර කමිටුවේ 52 වන හා 53 සැසිවාර සමඟ ආයෝජන, වෙළඳාම සඳහා පහසුකම් සැපයීම, සේවා, ප්‍රභවස්ථාන රීති සම්බන්ධ ක්‍රියාකාරි කමිටු රැස්වීම් පිළිවෙලින් 2018 වර්ෂයේ මාර්තු හා සැප්තැම්බර් මාසවල දී පවත්වන ලදී. එහි දී මෙම රැස්වීම්වලදී, අදාළ ක්‍රියාකාරි කමිටු එකඟතාවයන්ට අදාළ යොමු කිරිමේ අනුදේශ හා ප්‍රකාරතාවයන් පිළිබඳ කටයුතු අවසන් කටයුතු පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද අපනයන 2017 හා 2018 වර්ෂ සඳහා පිළිවෙලින් ඇමරිකන් ඩොලර් මිලියන 151.09 ක් හා ඇමරිකන් ඩොලර් මිලියන 156.25කි. මෙම ගිවිසුම යටතේ ප්‍රධාන අපනයන ද්‍රව්‍යය තේ වූ අතර, මීළඟට ප්‍රධානතම අපනයන භාණ්ඩ වූයේ පොල් හා සක්‍රිය කාබන් වේ. මෙම ගිවිසුම යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළදී ප්‍රභවස්ථාන සහතික 4,297ක් නිකුත් කර ඇත. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් වනුයේ චීනය, කොරියානු සමූහාණ්ඩුව හා ඉන්දියාව වේ.

### 5.4 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)

වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) විසින් සංවර්ධනය වන රටවල් අතර වෙළඳ අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා ආරම්භ කරනු ලැබූ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) 1989 අප්‍රේල් මස 19 වන දින සිට බලාත්මක විය. 2017 වර්ෂයේදී කොළොම්බියාව ඉවත් වන තුරුම මෙහි සාමාජික රාජ්‍ය සංඛ්‍යාව 43 ක් විය. ඇල්ජීරියාව, ආර්ජන්ටිනාව, බංග්ලාදේශය, බෙනින්, බොලිවියාව, බ්‍රසීලය, කැමරොන්, චිලී, කියුබාව, ඉක්වදෝරය, ඊජිප්තුව, මැකඩෝනියා, ඝානාව, ගිනියාව ගයනාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, ඉරාකය, උතුරු කොරියාව, දකුණු කොරියාව, ලිබියාව, මැලේසියාව, මෙක්සිකෝ, මොරොක්කෝ, මොසැම්බික්, මියන්මාරය, නිකරාගුවා, නයිජීරියා, පකිස්තානය, පේරු, පිලිපීනය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, සුඩානය, ටැන්සානියාව, තායිලන්තය, ට්‍රිනිඩෑඩ් හා ටොබාගෝ, ටියුනීසියාව, වෙනිසියුලාව, වියට්නාමය හා සිම්බාබ්වේ එහි වර්තමාන සාමාජික රාජ්‍යයන් වේ. ඇ.එ.ජ. ඩොලර් ට්‍රිලියන 11ක ඇස්තමේන්තුගත වෙළඳ පොළ අගයක් සමඟ සමස්ත ලෝක වෙළඳාමෙන් 20%ක් මෙම රටවල ආර්ථිකයන් මඟින් 2011 වර්ෂයේදී නියෝජනය විය.

මේ දක්වා, ගෝලීය වෙළඳ වරණ ක්‍රමයේ සාමාජික රාජ්‍ය අතර වෙළඳ එකඟතා වට 03ක් පවත්වා ඇත. බ්‍රසීලයේ සාඕ පාවුලෝහි UNCTAD සංවිධානයේ XI වන සමුළුව පැවති අවස්ථාවේ දී ආරම්භ කළ "São Paulo වටය" වසර 06ක් පුරා පැවති ප්‍රබල එකඟතාවලින් පසුව 2010 දෙසැම්බර් මස 15 වන දින අවසන් විය. සාඕ පාවුලෝ වටයේ වෙළඳ එකඟතා සඳහා ගෝලීය වෙළඳ වරණ ක්‍රමයේ සාමාජික රාජ්‍ය 22ක් සහභාගී වූ නමුත් එම රටවල් අතුරින් රටවල් 11ක් පමණක් සාඕ පාවුලෝ තෙවන වටයේ අවසාන සන්ධාන පත්‍රය සඳහා 2010 වර්ෂයේ දී අත්සන් කරන ලදී.
ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව විසින් 2018 වර්ෂයේදි සිදුකළ අපනයන, එහි 2017 වර්ෂයේ අගය සමඟ සංසන්දනය කිරිමේ දී වැඩි සංඛ්‍යාත්මක අගයක් පෙන්නුම් කරයි. මෙම ගෝලීය වෙළඳ වරණ

ක්‍රමය යටතේ සිදුකළ සමස්ත අපනයන වලින් ප්‍රධානතම අපනයන ද්‍රව්‍ය වනුයේ කුරුඳු ය. එය සමස්ත අපනයන වලින් 95% කි. ඉන්පසු ප්‍රධාන අයිතම වනුයේ පිළිවෙලින් තේ, පොල්, කඩදාසි ඇසුරුම් බහාලුම්, කඩදාසිබෝඩ් හා පුනක්කු වේ.

ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළදී ප්‍රභවස්ථාන සහතික 142 ක් නිකුත් කර ඇත. මෙම ක්‍රමය යටතේ ප්‍රධාන වෙළඳ පාර්ශවකරුවන් වනුයේ මෙක්සිකෝව හා පේරු රාජ්‍යය වේ.

## 5.5 අනෙකුත් අන්තර්ජාතික වෙළඳ ගිවිසුම්

### 5.5.1 බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC)

සමීප ආගමික සහයෝගිතාවයක් සහිත බෙංගාල බොක්ක ආශ්‍රිත වෙරළාසන්න හා යාබද ප්‍රදේශවල පැතිරී ඇති රටවල් හතක සමාජිකත්වයෙන් සමන්විත බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශය (BIMSTEC) කලාපීය සංවිධානයක් වේ. බැංකොක් ප්‍රකාශනය ඔස්සේ 1997 ජූනි මස 06 වන දින මෙම උප-කලාපීය සංවිධානය ආරම්භ විය. බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය, ශ්‍රී ලංකාව යන දකුණු ආසියාතික රටවල් 05කින් හා මියන්මාරය හා තායිලන්තය යන ගිණිකොන දිග ආසියාතික රටවල් 02කින් වශයෙන් සමස්ත සාමාජික රාජ්‍ය 07කින් මෙය සමන්විත වේ.

BIMSTEC නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ 21 වන වෙළඳ එකඟතා කමිටුව, 2018 නොවැම්බර් මස 18 සිට 19 දින දක්වා බංග්ලාදේශයේ ඩකා අගනුවර පවත්වන ලදී. භාණ්ඩ වෙළඳාම, ප්‍රභවස්ථාන රීති හා නිෂ්පාදන විශේෂිත නීති පිළිබඳ පෙළවල් මෙම රැස්වීමේ දී සාකච්ඡා කර ඉදිරියට ගෙන යන ලදී. තවද භාණ්ඩ පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා රැස්වීමේදී එකඟ විය. මෙම රැස්වීම අතර ප්‍රගතියක් පෙන්වූ එක් ක්ෂේත්‍රයක් වූයේ රේගු සහයෝගිතාවය පිළිබඳ ගිවිසුම වේ. තවද මෙම රස්වීමේදී ආරවුල් විසඳාලීම, වෙළඳාම සඳහා පහසුකම් සැපයීම, ආයෝජන හා සේවා යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. BIMSTEC නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ කටයුතු අවසන් කිරිම වේගවත් කිරීමේ අරමුණින් ප්‍රභවස්ථාන රීති හා ආයෝජන සම්බන්ධ ක්‍රියාකාරී කමිටුවල ඊළඟ රැස්වීම් වෙන වෙනම පැවැත්වීම සඳහා රැස්වීම විසින් එකඟ විය.

### 5.5.2 ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානය (IORA)

ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානය යනු ඉන්දියන් කලාපය තුළ කලාපීය සහයෝගීතාවය වැඩිදියුණු කිරිම හා තිරසර සංවර්ධනය තහවුරු කිරිම අරමුණු කරගත් අන්තර් රාජ්‍ය සංවිධානයකි. සාමාජික රාජ්‍ය 21ක් (ඕස්ට්‍රේලියාව, බංග්ලාදේශය, කොමරෝස්, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, කෙන්යාව, මැඩගස්කරය, මැලේසියාව, මුරුසි රාජ්‍යය, සෝමාලියාව, මොසැම්බික්, ඕමානය, ශීෂෙල්ෂ්. සිංගප්පූරුව, දකුණු අප්‍රිකාව, ශ්‍රී ලංකාව, ටැන්සානියාව, තායිලන්තය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා යේමනය) සහ සංවාද පාර්ශවකරුවන් 07 දෙනෙකුගෙන් (චීනය, ඊජිප්තුව, ප්‍රංශය, ජර්මනිය, ජපානය, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය) මෙම සංවිධානය සමන්විත වේ. දකුණු අප්‍රිකාව විසින් වර්තමාන සභාපතිත්වය දරනු ලැබේ.

මෙම කලාපීය සමුළුව මඟින් කලාපය තුළ රජය, ව්‍යාපාර සහ අධ්‍යයන නියෝජිතයන් යන ත්‍රෛපාර්ශවික අන්තර් සම්බන්ධතාවය ඒකරාශී කරනු ලැබේ. මෙම සංවිධානයේ ඉහළතම අධිකාරිත්වය සතු වනුයේ විදේශ අමාත්‍යවරුන්ගේ කවුන්සිලයට (COM) වන අතර එය වාර්ෂිකව හෝ සාමූහිකව තීරණය කරන පරිදි ඊට වැඩි අවස්ථා ගණනකදී සම්බන්ධ වනු ලැබේ. සාමාජික රාජ්‍යවල ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරින්ගෙන් සමන්විත ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවද (CSO) අවම වශයෙන් වසරකට වරක් රැස්වේ. මෙම කමිටුව විසින් විදේශ අමාත්‍යවරුන්ගේ කවුන්සිලය විසින් ගනු ලැබූ තිරණ ක්‍රියාත්මක කිරී,ම සමාලෝචනය කරන අතර, වෙළඳ හා ආයෝජන ක්‍රියාකාරි කමිටුව (WGTI), ඉන්දියන් සාගර කලාපීය ව්‍යාපාරික සමුළුව (IORBF) හා ඉන්දියන් සාගර අධ්‍යයන කණ්ඩායම (IORAG) යන ක්‍රියාකාරි කමිටු ත්‍රිත්වයේ ප්‍රතිඵලද පාලනය කරනු ලැබේ. කලාපයේ තිරසර වර්ධනය හා තුලනාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට කලාපිය සහයෝගීතාවය සඳහා ඉන්දියානු සාගර කලාපීය සංවිධානය විසින් හඳුනාගනු ලැබූ ප්‍රමුඛතා හෝ අවධානිත ක්ෂේත්‍ර 08ක් ඇත. එම ක්ෂේත්‍ර වනුයේ සමුද්‍රීය ආරක්ෂාව හා සුරක්ෂිතතාවය, වෙළඳාම හා ආයෝජනය සඳහා පහසුකම්

සැලසීම, ධීවර කළමනාකරණය, ආපදා අවදානම් කළමනාකරණය, සංචාරක හා සංස්කෘතික හුවමාරුව, අධ්‍යයන, විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය, සමුද්‍රීය ආර්ථිකය හා කාන්තාවන් ආර්ථික සවිබල ගැන්වීම වේ. මෙම වසර තුළදී සමුද්‍රීය ආර්ථිකය ආශ්‍රිත ඉසව් සඳහා වැඩි අවධානයක් ලබාදෙන ලදී.

2017 මාර්තු 07 වැනි දින ජකර්තාවල දී "සාමකාමී, ස්ථාවර හා සෞභාග්‍යමත් ඉන්දියන් සාගරයක් සඳහා සමුද්‍රීය සහයෝගිතාවය ශක්තිමත් කිරීම" මැයෙන් ප්‍රථම වරට පැවති ඉන්දියානු සාගර කලාපීය සංවිධානයේ නායකයන්ගේ රැස්වීම සඳහා ඉන්දුනීසියාව විසින් සත්කාරකත්වය දක්වන ලදී. මීට අමතරව විදේශ අමාත්‍යවරුන්ගේ කවුන්සිල් රැස්වීම දකුණු අප්‍රිකාවේ ඩර්බන්හි 2017 ඔක්තෝම්බර් 14 සිට 18 දක්වා පැවති අතර සිව්වන ඉන්දියානු සාගර සංවාදය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි වලදී ඔක්තෝම්බර් 9 හා 10 යන දිනවල සංවිධානය කරන ලදී.

2018 වර්ෂය තුළ, IORA පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වෘත්තීය නිපුණයන්ගේ රැස්වීම හා 2 වැනි IORA පුනර්ජනනීය බලශක්ති පිළිබඳ අමාත්‍ය මට්ටමේ රැස්වීම ඉන්දියාවේ නවදිල්ලි නුවර දී ඔක්තෝම්බර් මාසයේදී ද, IORA සමුද්‍ර සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබඳ ක්‍රියාකාරී කමිටුව පිහිටුවීම පිළිබඳ මූලික වැඩමුළුව ශ්‍රී ලංකාවේ කොළඹදී ද, "කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම - තිරසර සංවර්ධනය සඳහා වන පූර්ව අවශ්‍යතාවයකි" මැයෙන් IORA අමාත්‍ය මණ්ඩල සම්මන්ත්‍රණය මුරුසි රාජ්‍යයේ දී අගෝස්තු මාසයේදී ද, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කමිටුවේ (CSO) 8වන ද්වි-වාර්ෂික රැස්වීම දකුණු අප්‍රිකාවේ ඩර්බන්හිදී ජූලි මාසයේදී ද සහ නීල කාබන් පිළිබඳ IORA ඉන්දීය සාගර සමුළුව බටහිර ඕස්ට්‍රේලියාවේ දී මාර්තු මාසයේදී ද පැවැත්විණි.

## 6. වෙළඳ, ආයෝජන හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය

### 6.1 විදේශ වාණිජ නියෝජනය

වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යයේ එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 28 ක් නියෝජනය කරන නිලධාරීන් 30 කගෙන් සමන්විත වේ. වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය නියුක්ත වන ලදී. "රාජ්‍ය - පුද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන" යටතේ වාණිජ නිලධාරීන් විසින් පුළුල් පරාසයක වන කාර්යයන් ඉටු කරනු ලැබේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයේ නියුක්ත වාණිජ නිලධාරීන් හා ශ්‍රී ලංකාවේ අනෙකුත් ව්‍යාපාර සඳහා සහාය ලබාදෙන සංවිධානවල සහාය ඇතිව ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පවතින ජාත්‍යන්තර වෙළඳ පොළ තවදුරටත් පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාකාරකම් පෙළක් දියත් කරන ලදී. නව අපනයන ගමනාන්ත හඳුන්වාදීම සහ පවත්නා වෙළඳ පොළවල් වල තුළ වඩාත් හිතකර පරිසරයක් ඇති කරලීම ඔස්සේ ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ ප්‍රධාන අපනයනකරුවන්ගේ වෙළඳ පොළ පංගුකාරිත්වය වැඩි කිරීම සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරන අතරතුර, සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට ස්වකීය නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳ පොළ ප්‍රවේශය ලබාගැනීම සඳහා වාණිජ නිලධාරීන් අඛණ්ඩව සහයෝගය ලබාදෙන ලදී.

එතෙර සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් අතරට පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය;

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා අපනයන අවස්ථා හඳුනාගැනීම සඳහා වෙළඳ පොළ සමීක්ෂණ/ වාණිජමය අගයක් සහිත තොරතුරු සම්පාදනය කිරීම.

- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්තිවල වෙනස් වීම, විශේෂයෙන් බදු හා බදු නොවන පියවර අධීක්ෂණ කිරීම හා වාර්තා කිරීම.

- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම. ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීමෙහි ලා වඩාත්ම ඵලදායි මෙවලමක් වශයෙන් මෙම කාර්යය සලකනු ලැබේ.

- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.

- සත්කාරක රටවල ශ්‍රී ලංකාවට සුවිශේෂී (තනි රටක්) ප්‍රවර්ධන මෙහෙයුම් පැවැත්වීම.

- ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා වෙළඳ, ආයෝජන හා සංචාර දූත පිරිස් ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් වෙත සංවිධානය කිරීම

- ව්‍යාපාරික අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒක පුද්ගල ව්‍යාපාරික සංචාරකයන් ශ්‍රී ලංකාව වෙත හා ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් වෙත සංවිධානය කිරීම

- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ක්ෂේත්‍ර වල රජයේ නිලධාරීන් සමඟ සම්බන්ධ වීම සහ විවිධ රාජ්‍ය හා ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා හා සම්බන්ධ ගැටලු/ කරුණු වලට අදාළව ශ්‍රී ලංකාව නියෝජනය කිරීම

- වෙළඳ, ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විමසුම් සම්බන්ධයෙන් සේවා සැපයීම, විදේශ ව්‍යාපාරිකයන් හමුවීම/ඔවුන් සමඟ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලංකාවේ අපනයන කරුවන්ට තාක්ෂණික සහාය සැපයීම, වෙළඳ ආරවුල් නිරාකරණය කර ගැනීම ආදිය සඳහා සහාය ලබාදීම

අදාළ කාල පරිච්ඡේදය තුළ එතෙර සේවයේ නියුතු වාණිජ නිලධාරීන් විසින් ඉටුකළ කාර්යය පිළිබඳ සාරාංශයක් 02 වගුවේ දැක්වේ.
02 වගුව

| | කාර්යය | | මුළු එකතුව |
|---|---|---|---|
| 1 | සත්කාරක රටවල දී ශ්‍රී ලංකාවට සුවිශේෂී (තනි රටක්) ප්‍රවර්ධන මෙහෙයුම් පැවැත්වීම | | 112 |
| 2 | ශ්‍රී ලංකාව වෙත පැමිණි දූත පිරිස් | දූත පිරිස් සංඛ්‍යාව | 78 |
| | | දූත පිරිස්වල නියෝජිතයන් සංඛ්‍යාව | 1017 |
| 3 | සත්කාරක රටවලට ශ්‍රී ලංකාව විසින් යැවූ දූත පිරිස් | දූත පිරිස් සංඛ්‍යාව | 167 |
| | | දූත පිරිස්වල නියෝජිතයන් සංඛ්‍යාව | 1680 |
| 4 | ශ්‍රී ලංකාව වෙත සිදුකළ තනි පුද්ගල සංචාර | | 344 |
| 5 | ශ්‍රී ලංකාවෙන් සත්කාරක රටවලට සිදු කළ තනි පුද්ගල සංචාර | | 397 |
| 6 | සත්කාරක රටෙහිදී ප්‍රවර්ධනය කරන ලද ප්‍රදර්ශන | | 198 |
| 7 | සත්කාරක රට විසින් ශ්‍රී ලංකාවේ සිදුකළ අලෙවි ප්‍රදර්ශන සහභාගීවීම් | ප්‍රදර්ශන සංඛ්‍යාව | 49 |
| | | ප්‍රදර්ශකයන්/ අමුත්තන් සංඛ්‍යාව | 460 |
| 8 | සේවා ලබාදුන් විමසුම් සංඛ්‍යාව (වෙළඳ/ ආයෝජන/ සංචාරක ව්‍යාපාරය) | | 1,948 |
| 9 | පිළිතුරු ලබා දුන් වෙළඳ පැමිණිලි සංඛ්‍යාව | | 138 |
| 10 | ප්‍රවර්ධනය කළ නිෂ්පාදන අංශ සංඛ්‍යාව | | 134 |
| 11 | වාණිජ නිලධාරීන් විසින් සංචාරය කළ වෙළඳ ප්‍රදර්ශන සංඛ්‍යාව | | 67 |
| 12 | සත්කාරක රටෙහිදී වෙළඳ ප්‍රදර්ශන හා ව්‍යාපාර ජාල සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය | | 112 |
| 13 | ජාත්‍යන්තර සංවිධානවල දී/සමුළුවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | | 46 |
| 14 | ආයෝජන හා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම | | 168 |
| 15 | වෙළඳ පොළ තොරතුරු වාර්තා | | 19 |

6.1.1 **කාර්යසාධන ඇගයුම් නිර්ණායක**

**1. අපනයන ප්‍රවර්ධනය**

දූත මණ්ඩල විසින් හඳුන්වා දෙන විදේශ පාර්ශවකරුවන්ගෙන් ස්ථිර කරන ලද ඇණවුම් ලබා ගැනීමේ සාර්ථකත්වය, දූත මණ්ඩලය විසින් ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්බන්ධ කිරීමට අමතරව පහත දැක්වෙන කරුණු මත පාදක වේ. මෙම කරුණු ඉතා වැදගත් වන බව හා වෙළඳ ප්‍රවර්ධන නිලධාරීන්ගේ කාර්යවලින් බැහැර වන බවද සඳහන් කළ යුතු වේ. මෙම ක්ෂුද්‍ර සාධක හා සාර්ව සාධක එම නිලධාරීන්ගේ පාලනයෙන් බැහැර වන අතර සිදුකරන ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල සීමාවලට යටත් කෙරේ.

| ක්ෂුද්‍ර සාධක | සාර්ව සාධක |
|---|---|
| සමාගමේ සාමාන්‍ය අපනයන සූදානම/උනන්දුව | අඩු නිෂ්පාදන පිරිවැය සමඟින් තරඟකාරී ආර්ථිකය |
| තරඟකාරී මිල ගණන් (අනෙකුත් සැපයුම්කරුවන් සමඟ තරඟ කිරීම) | තාක්ෂණ කටයුතු සඳහා පවතින ආයෝජන මට්ටම සහ නව නිපැයුම් මට්ටම |
| නිෂ්පාදනයේ ගුණාත්මකබව | රටෙහි සම්පත් උරුමය |
| සැපයුම් ධාරිතාවය - විශාල පරිමාණයේ ඇණවුමක් නියමිත කාලයේදී සහ සාමාන්‍ය අයුරින් නිම කිරීමේ හැකියාව | වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ මට්ටම |
| ආනයනික රටෙහි නීති රෙගුලාසි හා අවශ්‍යතාවලට අනුකූලවීම | අයවැය හැකියාව |
| මූල්‍ය ප්‍රවර්ධන හැකියාව | |

**2. ආයෝජන හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය**

ඒ අයුරින්ම, ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල විසින් ආයෝජන හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත කටයුතු ආරම්භ කිරීමේ සිට එම කටයුතු ක්‍රියාත්මක වන තුරු ඇතිවන යම් පැමිණිල්ලක් සම්බන්ධයෙන් කටයුතු කිරීම පාලනයෙන් බැහැර කාර්යයන් වේ. මෙම ක්‍රියාවලියේ යම් සංරචක පිළිබඳ එකඟතාවයන්ට හා අන්‍යෝන්‍ය වශයෙන් හිතකර අවසානයන්ට එළඹීමේ කටයුතු සාර්ථක කර ගැනීම, අදාළ පුද්ගලික අංශයේ වගකීමට යටත් වේ.

එනිසා, දූත මණ්ඩලයක කාර්යසාධනය ගනණය සඳහා අදාළ දූත මණ්ඩලය විසින් සිදුකරන ලද මූලික ක්‍රියාකාරකම්වලට අනුරූපව එහි පරිමාව, තීව්‍රතාවය හා ඉලක්කය මැනිය යුතු බව යෝජනා කෙරේ.

වර්ෂය තුළදී වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද තෝරාගත් ප්‍රධාන වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පහත ලැයිස්තු ගතකර ඇත;

- සිලෝන් ටී, කුළුබඩු, අත්කම් නිර්මාණ, අත්යන්ත්‍ර රෙදිපිළි, ආයුර්වේද නිෂ්පාදන, සෙරමික් නිෂ්පාදන හා නිල් මැණික් හා වටිනා ගල් වලින් නිෂ්පාදිත ස්වර්ණාභරණ ඇතුළුව ශ්‍රී ලංකාවේ මැණික් සම්බන්ධ ප්‍රවර්ධන කටයුතු සඳහා 'මිලදී ගන්න සහ ශ්‍රී ලංකාව සමඟ ආයෝජන සිදුකරන්න' යන තේමාව යටතේ ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා සහ ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස දැනුවත් කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේ 70 වෙනි නිදහස් දින සැමරුමට සමගාමීව "ශ්‍රී ලංකාවේ මුහුණුවර - Facets of Sri Lanka" මැයෙන් වූ උත්සවයක් 2018 පෙබරවාරි මස 04-09 වන දින දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරදී සංවිධානය කරන ලදී.

- 2018 ජූනි මස 24-26 දක්වා ජොහැන්නස්බර්ග්, මිඩ්රන්ඩ්හි ගෝල්ලැග්හර් කන්වෙන්ෂන් සෙන්ටර්හිදී පැවති දකුණු අප්‍රිකානු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයේදී (SAITEX 2018) දකුණු අප්‍රිකාවේ, ප්‍රේටෝරියාහි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හා පොල් සංවර්ධන අධිකාරියේ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන කුටියක් සංවිධානය කරන ලදී.

- 2018 ෆයින් ෆුඩ් ඕස්ට්‍රේලියා ප්‍රදර්ශනය සඳහා සහභාගිවූ පොල් නිෂ්පාදන අපනයනකරුවන් සඳහා ශ්‍රී ලංකාවේ පොල් සංවර්ධන අධිකාරිය සිඩ්නිවල පිහිටි ශ්‍රී ලංකාවේ කන්සියුලර් ජෙනරල් කාර්යාලය සමඟ එක්ව ව්‍යාපාරික හමුවක් (Business Breakfast Meeting) මෙල්බන් නගරයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ ඕස්ට්‍රේලියාවේ ශක්‍යතාවයක් සහිත ව්‍යාපාරික පාර්ශවකරුවන සහ ගැණුම්කරුවන් සමඟ සම්බන්ධ වීම මනා සහභාගිත්වයක් දැරූ මෙම හමුවේ අරමුණ විය. වෙළඳ, ව්‍යාපාරික හා ආයෝජන අවස්ථා සම්බන්ධව අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වීමේ සහ සාකච්ඡා කිරීමේ අවස්ථාව 60කට අධික සහභාගිවූවන් සඳහා මෙමගින් හිමිවිය.

- 2018 නොවැම්බර් මස 5-10 දින දක්වා ෂැන්ග්හයි හි ප්‍රථම වරට පැවති චීන ආනයන ප්‍රදර්ශනය (China Import Expo) අතරවාරයේදී ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු අපනයනකරුවන්ගේ සංගමය හා ශ්‍රී ලංකාවේ මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය විසින් චීන කෘෂිකාර්මි තොග හ වෙළඳ සංගමය (CAWA) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් මෙම කාර්ය මූලාරම්භ කරන ලද්දේ බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ වාණිජ අංශය විසිනි.

- ජොහැන්නස්බර්ග් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (JCCI) සමඟ සහයෝගිතාවයෙන් දකුණු අප්‍රිකාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය විසින් **"**ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු ව්‍යාපාරික හමුව**'** 2018 නොවැම්බර් මස 16 වන දින **JCCI** ශ්‍රවණාගාරයේදී සාර්ථක අයුරින් සංවිධානය කරන ලදී. 2018 නොවැම්බර් මස 13-15 වන දින දක්වා ජොහැන්නස්බර්ග්හි ගෝල්ලැග්හර් කන්වෙන්ෂන් සෙන්ටර්හිදී පැවති COMPLAST 2018 සඳහා සහභාගී වී සිටි ශ්‍රී ලංකාවේ රබර් හා ප්ලාස්ටික් අපනයනකරුවන් සඳහා ව්‍යාපාරික රැස්වීම් **(B2B)** සඳහා පහසුකම් සැලසීම මෙහි අරමුණ විය. ඉන් අනතුරුව ජාලකරණ B2B සැසියක් පැවති අතර එහිදී 50කට අධික දකුණු අප්‍රිකානු ව්‍යාපාර ශ්‍රී ලාංකික නියෝජිතයන් සමඟ සම්බන්ධ වී සාර්ථක අන්දමින් සාකච්ඡා පවත්වන ලදී.

- සිඩ්නි හා මෙල්බර්න් ශ්‍රී ලංකා කොන්සියුලර් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය සමඟ සහයෝගීතාවයෙන් ව්‍යාපාරික දූත පිරිසකට මෙල්බන් නුවර පැවති International Sourcing expo සඳහා සහභාගී වීමේ අවස්ථාව සංවිධානය කරන ලදී. මෙම සංචාරයෙන් අනතුරුව ඕස්ට්‍රේලියාවේ වෙළඳ මණ්ඩල හා සංවිධාන සමඟ ව්‍යාපාරික රැස්වීම් ගණනාවක් පවත්වන ලදී.

- රියාද්හි පැවති සවුදි හෝරේකා ආහාර සහ පාන වර්ග ප්‍රදර්ශනයේ දී හා ජෙඩා හි 2018 නොවැම්බර් මස පැවති සවුදි ෆුඩ්ටෙක්ස් ප්‍රදර්ශනයේදී සිලෝන් ටී හා අනෙකුත් ආහාර නිෂ්පාදන සාර්ථක අයුරින් ප්‍රවර්ධනය කිරීම සඳහා සවුදි අරාබියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ තේ මණ්ඩලයට හා තනි තනි වශයෙන් සහභාගී වූ අනෙකුත් සමාගම් වලට සහයෝගය දක්වන ලදී.

- ශ්‍රී ලංකාව වෙළඳ හා සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පරානා වාණිජ සංගමයේ සහයෝගිතාවයෙන් කුඩා පරිමාණ ප්‍රදර්ශනයක්, තේ රස බැලීමේ අවස්ථාවක් හා විවිධ ඉදිරිපත් කිරීම් 2018 දෙසැම්බර් පළමු සතියේදී සිදුකරන ලදී.
- 2018 සැප්තැම්බර් මස 17-20 වන දින දක්වා දෙවන වරටත් පැවති "Apparel Sourcing Fair" ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ වාණිජ අංශය විසින් අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගිතාවයෙන් සංවිධානය කරන ලදී. ඇඟළුම් අපනයනකරුවන් හයදෙනෙකු හා ඇඳුම් නිර්මාණ ශිල්පීන් දෙදෙනෙකු මීට

සහභාගිවන ලදී. පුවත්පත් සාකච්ඡාව සඳහා සහ ශ්‍රී ලංකාවේ විලාසිතා ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාව සහභාගී විය. ව්‍යාපාරික හමුවීම් සඳහා අවස්ථා ලබාගැනීමට සමාගම් සමත් වූ අතර, ඉන් සමහරක් සමාගම් සිය ඇණවුම් තහවුරු කරගැනීම ද සිදුවිය.

- 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයින්ගේ රැස්වීම (CHOGM 2018) අතර වාරයේදී අප්‍රේල් මස 16-18 දක්වා පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික හමුව ද පවත්වන ලදී. තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, ඉලෙක්ට්‍රොනික්, ඇඟලුම්, අත්කම්, පොල්, සංචාරක කර්මාන්තය, මැණික් හා ස්වර්ණාභරණ, සමුද්‍ර හා බෝට්ටු තැනීම්, වෛද්‍ය, සැපයුම් දාම හා උපදේශක සේවා වැනි අංශ නියෝජනය කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 40 කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් වාණිජ දෙපාර්තමේන්තුව විසින් අපනයන සංවර්ධන මණ්ඩලය, විදේශ කටයුතු අමාත්‍යාංශය හා ලන්ඩන් නුවර ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය සමඟ එක්ව සංවිධානය කරන ලදී. මෙකී හමුව සඳහා සහභාගී වූ විශාලම ව්‍යාපාරික දූත පිරිස වශයෙන් මෙම ශ්‍රී ලාංකික සහභාගීවූවන් දැනුම හුවමාරු කරගැනීමේදී සුවිශේෂී භූමිකාවක් ඉටු කළ අතර ශ්‍රී ලංකාව හා අනෙකුත් සාමාජික රාජ්‍ය අතර අන්තර් පොදුරාජ්‍ය මණ්ඩලීය වෙළඳාම හා ආයෝජන කටයුතු ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ව්‍යාපාරික සබඳතා ගණනාවක් ඇතිකර ගන්නා ලදී.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා අනෙකුත් අදාළ ආයතන සමඟ එක්වී ටොරොන්ටෝවල පිහිටි ශ්‍රී ලංකාවේ කොන්සියුලර් ජෙනරල් කාර්යාලය විසින් ආහාර හා පානවර්ග ක්ෂේත්‍රයේ විශාලතම ජාත්‍යන්තර ප්‍රදර්ශන වලින් එකක් වන SIAL Canada 2018 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සම්බන්ධීකරණය කරන ලදී. ප්‍රදර්ශනය අතරවාරයේ දී සංවිධානය කළ ව්‍යාපාරික හමුවීම් වලින් ශ්‍රී ලංකාවෙන් සහභාගීවූවන් සඳහා ප්‍රයෝජනවත් වෙළඳ සම්බන්ධතා තහවුරු කරගැනීම සිදුවිය.

වෙළඳ ප්‍රවර්ධන අවස්ථා සංවිධානය කිරීමට අමතරව, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සඳහා ව්‍යාපාරික අවස්ථා අනාවරණය කරගැනීමේ අරමුණින් වාණිජ නිලධාරින් විසින් නිරන්තරයෙන් සිය අදාළ/ පත්කළ රටවල් තුළ පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

## 6.2. සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම

එතෙර සේවය සඳහා ස්ථානගත කර සිටින වාණිජ නිලධාරීන් රට තුළට සෘජු විදේශ විනිමය ආකර්ෂණය කර ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් අඛණ්ඩව සිදු කරනු ලැබේ. මේ සඳහා එතෙර සිටින ප්‍රධාන ආයෝජකයන් හා ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන සමඟ දැඩි සබඳතා ජාල ඇතිකර ගැනීමේ කාර්යයයේ ඔවුන් නියුක්තව සිටිනු ලැබේ. තවද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කිරීම සඳහා ශක්‍යතාවය සහිත හවුල් ව්‍යාපාර පාර්ශවකරුවන් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් එම රටවලට පැමිණෙන ව්‍යාපාරික දූත පිරිස් සඳහා තනි තනි ව්‍යාපාරික හමුවීම් සංවිධානය කිරීමද මොවුන් විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී වාණිජ නිලධාරීන් විසින් ශක්‍යතා සහිත ආයෝජකයන් ඔවුන්ගේ වෙළඳපොළවල් වලදී හමුවී දිවයින තුළ පවතින ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර ඇත.

වාණිජ නිලධාරීන් විසින් පහසුකම් සපයා ඇති තෝරාගත් ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ;

- ශ්‍රී ලංකාව හා කොරියාව අතර ධීවර කර්මාන්ත අතර පවතින සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් දකුණු කොරියාවේ ධීවර සමුපකාර ජාතික සම්මේලනයේ (NFFC) සභාපති, කිම්-ඉම්-කෙවොන්ගේ ප්‍රධානත්වයෙන් සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් සඳහා 2018 ජනවාරි මස 15-19 වන දින දක්වා වැඩසටහනක් ශ්‍රී ලංකාවේ දී සංවිධානය කරන ලදී. ප්‍රධාන වශයෙන් සමුද්‍ර හා වෙරළාසන්න ජලජීවී වගාව, මත්ස්‍ය

සැකසුම් කර්මාන්තය හා මසුන් ඇල්ලීමේ බෝට්ටු කර්මාන්තය සම්බන්ධ සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ හැකියාව සම්බන්ධයෙන් දූත පිරිස කරුණු විමසා බලන ලදී.

- වෙන්නායිහි ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් OEG Pharma සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ශ්‍රී ලංකා සංචාරයක් සඳහා පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලයේ සභාපති හමුවී ඔවුන්ගේ ව්‍යාපෘති යෝජනාව සාකච්ඡා කිරීම සඳහා අවස්ථාව ලබාදීම මෙහිදී සිදු විය. තවද, 2018 පෙබරවාරි 24-26 දක්වා විශාකාපත්තනම්හි පැවති 2018 - CII හවුල්කාරිත්ව සමුළුව සඳහා සහභාගී වීමේ අවස්ථාව ශ්‍රී ලංකාවේ සමාගම් 05ක් සඳහා ලබාදීමට ද වෙන්නායිහි නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී.

- ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කිරීම සඳහා අපේක්ෂාවෙන් සිටි 15කට අධික ප්‍රංශ සමාගම්වල සහභාගිත්වයෙන් MEDEF ඉන්ටර්නැෂනල් හි සංවිධානය කළ ආයෝජන සමුළුව සඳහා ශ්‍රීලංකාවේ මහනගර සහ බස්නාහිර සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ සහභාගීත්වය සඳහා ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් පහසුකම් සලසන ලදී. ඔහුගේ සංචාරයට සමගාමීව ප්‍රංශ සමාගම් කිහිපයක් සමඟ ද්විපාර්ශවික රැස්වීම් කිහිපයක් ද සංවිධානය කරන ලදී. එසේ පැවති රැස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා ආයෝජන යෝජනාවක් පිළියෙල කිරීමට තොරතුරු රැස් කිරීම සඳහා ෆ්‍රෙන්ච් නැෂනල් රේල්වේ සමාගමේ (SNCF) දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී.

- "සමාජ ව්‍යවසායකයන් සඳහා වේදිකාව" නිර්මාණය කිරීමේ නියුක්ත බෝඩර්ලස් ජැපෑන් ආයතනය සමඟ ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය රැස්වීමක් පවත්වන ලදී. කෙටි කාලසීමාවක් තුළ දී සමාජය වෙනස් කිරීමේ ශක්‍යතාවයකින් හෙබි නව සමාජ ව්‍යාපාර නිර්මාණය කිරීමේ අභිලාෂයෙන් යුතු ව්‍යවසායකයන් වෙනුවෙන් ජපාන යෙන් මිලියන 30ක් ආයෝජනය කිරීමට එම ආයතනය එකඟතාවය පළ කරන ලදී.

- සිංගප්පූරු ශ්‍රී ලංකා ව්‍යාපාර සංගමය, කොළඹ කොටස් වෙළඳ පොළ සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන්න මැයෙන් වූ සමුළුව 2018 මාර්තු මස 01 වන දින සිංගප්පූරුවේ ෆෝ සීසන්ස් හෝටලයේදී සංවිධානය කරන ලදී. සිංගප්පූරුවේ 350කට අධික සමාගම්, ආයෝජකයන් හා අරමුදල් කළමනාකරුවන් මීට සහභාගී වූ අතර, ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙහි ප්‍රධාන අමුත්තා වූ අතර, සිංගප්පූරුවේ වෙළඳ හා කර්මාන්ත ඇමති එස්.ඊස්වරන් මහතා ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.

- කැනඩාවේ ශ්‍රී ලංකාවේ කොන්සියුලර් ජෙනරල් කාර්යාලය විසින් සංවිධානය කළ ආයෝජන ඇරයුම් වැඩසටහනක ප්‍රතිඵලයක් ලෙස කැනේඩියානු සමාගමකින් ලැබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සැලසුම් යෝජනාවක් දැනට සාකච්ඡා කරමින් පවතී. මෙම ව්‍යාපෘති යෝජනාව වනුයේ ඝන අපද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තනය කිරීමයි.

- මහනගර සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් ලොස් ඇන්ජලීස්හි ශ්‍රී ලංකාවේ කොන්සියුලර් ජෙනරල් කාර්යාලය විසින් "Partner Sri Lanka" මැයෙන් විශේෂ ඍජු විදේශ ආයෝජන වැඩසටහනක් සංවිධානය කරන ලදී. 2018 අප්‍රේල් මාසයේ දින 04ක් පුරා මෙම වැඩසටහන කැලිෆෝනියා හා නවේඩා ප්‍රාන්තවල දියත් කරන ලදී. මහනගර සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු සාමාජිකයන් සිවු දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් මෙම වැඩසටහනට සහභාගී වූ අතර ප්‍රවාහන, බලශක්ති, ජල, සමුද්‍ර හා සැපයුම් දාම, අපද්‍රව්‍ය කළමනාකරණය ආදී ක්ෂේත්‍රවල ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් ශක්‍යතාවය සහිත ආයෝජකයන් සමඟ සාකච්ඡා පවත්වන ලදී.

- ජර්මනියේ වෙළඳ හා කර්මාන්ත මණ්ඩල, ජර්මනියේ ඒෂියා පැසිෆික් ව්‍යාපාර සංගමය, ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය සමඟ සහයෝගීතාවයෙන් ජර්මනියේ, ෆ්‍රෑන්ක්ෆර්ට්හි ශ්‍රී ලංකා කොන්සියුලේට් කාර්යාලය විසින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ ගරු අමාත්‍යතුමාගේ සංචාරය හා 2018 සැප්තැම්බර් 24-27 දක්වා ෆ්‍රෑන්ක්ෆර්ට්, හැම්බර්ග් හා බර්ලින්හි පැවති ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධන රෝඩ් ෂෝ වැඩසටහන් සඳහා පහසුකම් සලසන ලදී. මේ අතර කාලය තුළ ආයෝජන හා වෙළඳ ප්‍රවර්ධන නියෝජිතායතන හා තනි තනි සමාගම් සමඟ වෙන් වෙන් වශයෙන් වූ රැස්වීම් කිහිපයක් ද පවත්වන ලදී. සෑම නගරයකම පැවති සමුළු සඳහා 100කට අධික පිරිස බැගින් සහභාගී වන ලදී.

- පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යවසාය හා ආයෝජන කවුන්සිලය (CWEIC) හරහා "ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම(IFC)- අවස්ථා සහ අභියෝග" යන මාතෘකාව යටතේ වූ වටමේස සාකච්ඡාවක් ලන්ඩන්හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාව සඳහා ලොව පුරා මෙම ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමේ කටයුතුවල නිරතව සිටින නීති උපදේශකවරු ගණනාවක් සහ අනෙකුත් පාර්ශව සහභාගී විය. මෙම රැස්වීමේ අරමුණ වූයේ කොළඹ වරාය නගරය තුළ ස්ථාපනය කිරීමට නියමිත කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) ප්‍රවර්ධනය කිරීම හා වෘත්තීයවේදීන්ගෙන් අදහස් ලබාගැනීම වේ.

### 6.3. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

සංචාරක අංශයේ ඇති අසීමිත විභවය හඳුනා ගෙන ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සහයෝගීතාවයෙන් විදේශ රටවලදී විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. විශේෂ සමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම, ශ්‍රී ලංකාව සම්බන්ධව ප්‍රවර්ධන ඉසව් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් සඳහා සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් හා සංචාරක නියෝජිතයන් සඳහා දැනුවත් කිරීමේ සංචාර සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන කවුන්සිල් පිහිටුවීම, සත්කාරක රටවල් වලදී ඉලෙක්ට්‍රොනික් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණ ලබාදීම ආදිය ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් යොදාගන්නා ප්‍රධාන උපාය මාර්ග අතර වේ.

ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එතෙර දූත මණ්ඩල විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහ අනෙකුත් ශ්‍රී ලංකාවේ වග කිවයුතු ආයතන සමඟ සහායෝගිතාවයෙන් සංවිධානය කළ ප්‍රධාන කාර්යය කිහිපයක් පහත දැක්වේ;

- වාර්ෂිකව 35,000කට අධික සංචාරකයන්, 5,000ක ප්‍රදර්ශකයන් හා 2,000කට අධික සංචාරක නියෝජිතවරුන් හා සංචාර මෙහෙයුම්කරුවන් හා ප්‍රධාන ගෝලීය සංචාරක මාධ්‍ය ආකර්ෂණය කරගනිමින් පැවැත්වෙන සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛ ගෝලීය ඉසව්වක් වන ලෝක සංචාරක වෙළඳ පොළ (WTM) -2018ට සමගාමීව, ලන්ඩන් නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සඳහා සිය නවතම ගමනාන්ත සන්නාමය වන 'So Sri Lanka' ලන්ඩන් නුවරදී 2018 නොවැම්බර් මස 05 වන දින එළි දැක්වීම සඳහා පහසුකම් සපයන ලදී. ලන්ඩන් නුවර එක්සෙල් ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ 2018 නොවැම්බර් 5-7 වන දින දක්වා පැවති ලෝක සංචාරක වෙළඳ පොළ (WTM) සඳහා අනෙකුත් සහභාගිකයන් අතර ශ්‍රී ලංකාව් කර්මාන්ත පාර්ශවකරුවන් 60කට අධික පිරිසක්ද සහභාගී වන ලදී.

- රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, හේලීස් සමූහ ව්‍යාපාරයේ අමායා හිල්ස් හෝටලය සමඟ ඒකාබද්ධව පෙබරවාරි 09-15 වන දින දක්වා ශ්‍රී ලංකා ආහාර සතියක් පවත්වන ලදී.

- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ජෙඩාහි ශ්‍රී ලංකාවේ කොන්සියුලර් ජෙනරල් කාර්යාලය හා සවුදි අරාබියේ රියාද්හි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලය සමඟ සහයෝගීතාවයෙන් සවුදි අරාබියේ ප්‍රධාන නගර ත්‍රිත්වය වන ජෙඩා, රියාද් හා දම්මාන් නගර වලදී ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන රෝඩ් ෂෝ වැඩසටහන් 2018 පෙබරවාරි හා අප්‍රේල් මාස වලදී සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සිඩ්නිවල ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරල් කාර්යාලය සමඟ සහයෝගිතාවයෙන් ඩාර්ලින්ග් හාබර්, ඩොක්සයිඩ්හි 2018 අගෝස්තු 21-22 වන දින දක්වා පැවති සංචාරක කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලදී. ඩොක්සයිඩ් කෝල්ඩ් රූම්හිදී ප්‍රදර්ශනයේ පළමු දිනයේදී ශ්‍රී ලංකාවේ උදෑසන ආහාර වේලක් සමඟ මාධ්‍ය හමුවක්

සංවිධානය කරන ලද අතර 40කට අධික මාධ්‍යවේදීන් හා සංචාරක වෙළඳ සාමාජිකයන් ජාලකරණ රැස්වීම සඳහා සහභාගී විය.

- ස්විට්සර්ලන්තයේ ලියුගානෝ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ දී නොවැම්බර් මස 01-04 වන දින දක්වා පැවති ස්විස් ජාත්‍යන්තර නිවාඩු ප්‍රදර්ශනය (Swiss International Holiday Exhibition) සඳහා ලෝක වෙළඳ සංවිධානයේ ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලය විසින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකාව සම්බන්ධිත වාර්තා වීඩියෝ සඳහා රුසියාවේ වඩාත් ප්‍රමුඛත්වය උසුලන කල්ටුරි (සංස්කෘතිය) රූපවාහිනී චැනලය වෙත එරටට පැමිණ සිටි ජනමාධ්‍යවේදීන් සඳහා සංචාරයක් රුසියානු තානාපති කාර්යාලය විසින් සංවිධානය කළ අතර, වාර්තා වීඩියෝව රූපගත කිරීම සඳහා සංචාරයක් සඳහා කටයුතු ද සංවිධානය කරන ලදී.

- ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් වශයෙන් සංචාරක හා ආයතනික සේවාදායකයන් අතර දැනුවත් කිරීම සඳහා රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන (MICE) යන සංචාරක කාණ්ඩය සම්බන්ධිත "MICE 2018 "Meet in Sri Lanka" මැයෙන් වූ සමුළුවක් 2018 ඔක්තෝම්බර් මස 16 වන දින පැවැත්විණි. මෙය සංවිධානය කරනු ලැබුවේ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සමඟ සහයෝගීතාවයෙන් සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසිනි.

- ඒරෝෆ්ලොට් රෂියන් එයාර්ලයින්ස් හා පැසිෆික් ඒෂියා ට්‍රැවල් ඇසෝසියේෂන්හි (PATA) ස්වීඩන් ශාඛාව සමඟ සහයෝගීතාවයෙන් ස්ටොක්හෝම්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ස්වීඩනයේ ස්ථානගත සංචාරක සමාගම් සඳහා "ශ්‍රී ලංකා සැඳෑවක්" - A Sri Lanka Evening සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පිළිබඳ තොරතුරු සේම ඒරෝෆ්ලොට් රෂියන් එයාර්ලයින්ස් මඟින් අළුතින් නැවත ආරම්භ කරනු ලැබූ ගුවන් ගමන් වාර පිළිබඳ තොරතුරු සැපයීම ඔස්සේ ස්වීඩන් සංචාරක නියෝජිතයන් වෙත ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස හඳුන්වා දීම මෙහි අරමුණ විය.

## 6.4. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ප්‍රධාන වෙළඳ ප්‍රවර්ධන කටයුතු

### 6.4.1 Biofach 2018 ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකාවේ සහභාගිත්වය

නියුරෙම්බර්ගි පෙබරවාරි 15-18 වන දින දක්වා පැවති Biofach 2018 ප්‍රදර්ශනයේදී ෆ්‍රැන්ක්ෆර්ට්හි ශ්‍රී ලංකා කොන්සියුලර් කාර්යාලය සමඟ එක්ව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ කුටියක් සංවිධානය කරන ලදී. කාබනික ආහාර සහ පාන වර්ග සම්බන්ධයෙන් ලොව ප්‍රධානතම වෙළඳ ප්‍රදර්ශනය වනුයේ මෙම Biofach ප්‍රදර්ශනය වේ. මෙම වර්ෂයේ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශකයන් 2,962කට අධික සංඛ්‍යාවක් විසින් පුළුල් පරාසයක විහිදි ආහාර නිෂ්පාදන ඉදිරිපත් කරන ලදී. ලොව පුරා විසිරි සිටින ප්‍රමුඛ ආනයනකරුවන් සමඟ සබඳතා ඇතිකර ගැනීම සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට මෙහිදී අගනා අවස්ථාවක් හිමිවිණි. මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලාංකික අපනයනකරුවෝ 25 දෙනෙක් සහභාගි වූහ. එයින් සමාගම් හයක් වාණිජ දෙපාර්තමේන්තුව සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අනුග්‍රාහකත්වය යටතේ සහභාගි විය. මෙම ප්‍රදර්ශන කාල සීමාව තුළ හා ඉන්පසුවද මෙම සමාගම් වෙත අපනයන ඇණවුම් සැලකිය යුතු ප්‍රමාණයක් ලැබී තිබුණි.

### 6.4.2 බෙල්ජියම් බෝට්ටු සංදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ දූත පිරිසේ සංචාරය

බෙල්ජියම් බෝට්ටු සංදර්ශනය යනු බෙල්ජියමේ බෝට්ටු අංශය සඳහා ඇති විශාලතම වෙළඳ ප්‍රදර්ශනය වේ. කුඩා හුළං පිරවිය හැකි බෝට්ටුවේ සිට සුපිරිතම රුවල් නැව් හා ඒ ආශ්‍රිත උපකරණ දක්වා ජල ක්‍රීඩා, ජලය ආශ්‍රිත විනෝදාස්වාද කටයුතු සහ ජල සංචාරක කර්මාන්තය මෙම ප්‍රදර්ශනය මඟින් ආවරණය වේ. වාණිජ

දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ දූත පිරිසක් 2018 පෙබරවාරි 10-12 දක්වා සහ 16-18 දක්වා ග්හෙන්ට් හි පැවති මෙම බෝට්ටු සංදර්ශනය සඳහා සහභාගී විය. මෙම සංදර්ශනයට සමගාමීව, බෙල්ජියමේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ වාණිජ අංශය විසින් බෙල්ජියමේ බෝට්ටු ක්ෂේත්‍රයේ නියෝජිතයන් සමඟ සාර්ථක රැස්වීම් මාලාවක්ද සංවිධානය කරන ලදී. මීලඟ බෙල්ජියම් බෝට්ටු සංදර්ශනයේදී ආගන්තුක රට ලෙස ශ්‍රී ලංකාවට සහභාගී වන ලෙස එම බෙල්ජියම් බෝට්ටු සංදර්ශනයේ ප්‍රධානියා විසින් ආරාධනා කළ අතර ශ්‍රී ලාංකීන සමාගම් සමඟ සමීප සහයෝගිතාවයක් පවත්වා ගැනීම සඳහා බෙල්ජියම් බෝට්ටු සමාගම් වැඩි උනන්දුවක් දක්වන ලදී.

### 6.4.3 ජිනෝආ හා මිලාන් වෙත වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධන සංචාරය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බෝට්ටු නිෂ්පාදකයන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත වෙළඳ ප්‍රවර්ධන සංචාරයක් ජිනෝආ හා මිලාන් වෙත 2018 සැප්තැම්බර් 22-26 දක්වා රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මෙම ප්‍රවර්ධන කටයුත්ත අතරතුර ශ්‍රී ලංකා දූත පිරිස "ජිනෝආ ජාත්‍යන්තර බෝට්ටු සංදර්ශනය -2018" සඳහා සංචාරය කරන ලදී. ජිනෝආ ජාත්‍යන්තර බෝට්ටු සංදර්ශනය යනු යුරෝපා කලාපයේ විශාලතම ජාත්‍යන්තර බෝට්ටු සංදර්ශනයයි. නිෂ්පාදනය කරනු ලබන සියලුම වර්ගයේ බෝට්ටු, ප්‍රධාන වශයෙන්ම රුවල් නැව්, විනෝද යාත්‍රා හා බෝට්ටු අමතර උපාංග මෙහිදී ප්‍රදර්ශනය කෙරේ. ශ්‍රී ලංකා දූත පිරිස ඉතාලියේ ප්‍රධාන බෝට්ටු නිෂ්පාදකයන් වෙතද සංචාර සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ බෝට්ටු සෑදීමේ හා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ ශක්‍යතා හා අපේක්ෂා සහගත ඉදිරිය සම්බන්ධයෙන් මෙන්ම මෙම විෂයය සම්බන්ධයෙන් දැනුම, ප්‍රායෝගික නිපුණතා හා තාක්ෂණය අවබෝධ කර ගැනීම සඳහා මෙම සංචාරය මඟින් ඉතාලි බෝට්ටු නිෂ්පාදකයන් වෙත අගනා අවස්ථාවක් හිමි විය.

### 6.5. වෙළඳ, ආයෝජන හා සංචාරක කටයුතු පිළිබඳ විමසුම් සම්බන්ධයෙන් සේවා ඉටු කිරීම

වාණිජ දෙපාර්තමේන්තුව හා එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන් විසින් දේශීය සේම විදේශීය සමාගම් වෙතින් ලැබෙන වෙළඳ විමසුම් සඳහා අවශ්‍ය සේවා ඉටු කිරීමෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සිය දූත මණ්ඩල සහ රාජකාරි ස්ථානවලින් ලැබෙන වෙළඳ, ආයෝජන හා සංචාරක කටයුතු විමසුම් සඳහා එතෙර රටවල සේවයේ නියුතු වාණිජ නිලධාරීන් සම්බන්ධ වෙයි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී, වාණිජ නිලධාරීන් වෙත එවැනි විමසුම් 1948 ක ප්‍රමාණයක්පැමිණිලි 1,948ක් ලැබුණු අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළඳ පොළවල ප්‍රවර්ධනය කිරීමේ සහ ශ්‍රී ලංකාව ආයෝජන හා සංචාරක ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම විමසුම් සම්බන්ධයෙන් මනාව සලකා බලා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

වෙළඳ, ආයෝජන හා සංචාරක කටයුතු සම්බන්ධයෙන් විදේශීය ගැනුම්කරුවන්ගෙන් වාණිජ නිලධාරින් වෙත වර්ෂය තුළදී ලැබුණු විමසීම් ඔවුන් විසින් කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමේ කටයුතු සඳහා වෙළඳ හා කර්මාන්ත මණ්ඩල, වෙළඳ සංගම්, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ අනෙකුත් අදාළ අධිකාරි වෙත සේම අදාළ ශ්‍රී ලාංකික අපනයනකරුවන් වෙත යොමු කර ඇත. මෙම දෙපාර්තමේන්තුවට හා අනෙකුත් වෙළඳ කටයුතු නියෝජිතායතන වෙත ලැබුණු පැමිණිලි සඳහා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන් වෙත යොමු කර ඇත.

### 6.6 වෙළඳ ආරවුල් විසඳීම සඳහා සහයෝගය

අපනයන සහ ආනයන කටයුතු ආශ්‍රිත වෙළඳ ආරවුල් ඊට අදාළ පාර්ශව අතර සුහදශීලී අයුරින් විසඳාගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අතරමැදියෙකු/පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කරයි. සමාලෝචිත කාල සීමාව තුළ ලැබී ඇති එවැනි පැමිණිලි 137ක් සම්බන්ධයෙන් එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන්ගේ සහයෝගයෙන් අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

## 6.7 ශ්‍රී ලංකාවට විශේෂිත ප්‍රවර්ධන මෙහෙයුම්

එතෙර ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමේ සහ ලෝකය තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ අරමුණින් එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන් විසින් ඔවුන්ගේ අදාළ රටවල් තුළ ශ්‍රී ලංකාවට විශේෂිත විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරයි. මෙම 2018 වර්ෂය තුළ, ශ්‍රී ලංකාවට විශේෂිත වැඩසටහන් 112ක් සංවිධානය කර ඇත.

## 6.8 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වන නියෝජන හා කාර්යයන් සිදුකරන විදේශ සමාගම් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත් කිරීමේදී සලකා බැලීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් රේඛීය අමාත්‍යාංශවල නිර්දේශ ඉල්ලා සිටිනු ලැබේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් බලය පවරා ඇති පරිදි වාණිජ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණ කාර්යාල, ශාඛා කාර්යාල හෝ විදේශ සමාගම්, අනෙකුත් වෙළඳ හා වාණිජ ව්‍යාපාරවල සේවයේ යොදවා ඇති නිපුණ විදේශ පුද්ගලයන්, උපදේශකයන්, විශේෂඥයන් හා ඔවුන්ගේ යැපෙන්නන් සඳහා එවැනි සේවා නියුක්ත කරවීම් වලින් අපනයන වෙළඳාම, ජාතික ආර්ථිකය සඳහා වන තාක්ෂණික හුවමාරුව හා ඵලදායිතා වැඩිදියුණුව සැලකිල්ලට ගෙන නිර්දේශ ලිපි නිකුත් කරනු ලැබේ.

2018 වර්ෂය තුළදී , වාණිජ දෙපාර්තමේන්තුව විසින් එක් අවුරුදු කාල සීමාවක් සඳහා ප්‍රවේශ වීසා හා වීසා දිගු කිරීම් සඳහා ජාතීන් 27කට අයත් අයදුම්කරුවන් 146කට සහ ඔවුන්ගේ යැපෙන්නන් 114 දෙනෙකුට නිර්දේශ කිරීමේ ලිපි නිකුත් කර ඇත.

## 6.9 ණය දෙන ආයතන අනුමත කිරීම

1949 අංක 06 දරන උකස් පනත යටතේ, සමාගමක්, ආයතනයක් හෝ තැනැත්තෙකු අනුමත කරන ලද ණය නියෝජිතායතනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ සිය අනුමැතිය ලබා දෙනුයේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114(1) වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා තවත් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මතය.

2018 වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් 04ක් ලැබී ඇති අතර, එම අයදුම්පත් අතුරින් එක් ආයතනයක් සඳහා මණ්ඩලයේ නිර්දේශ මත අනුමත ණය දෙන ආයතනයක තත්ත්වය පිරිනමා ඇත.

## 6.10 යුරෝපා සංගමය මගින් අරමුදල් සම්පාදිත වෙළඳාම ආශ්‍රිත ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතිය

18 වන යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර පැවති 18 වන ඒකාබද්ධ කමිටුවට සමගාමීව 2013 දෙසැම්බර් මස 02වන දින බ්‍රසල්ස්හි පැවති යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ හා ආර්ථික සබඳතා පිළිබඳ ක්‍රියාකාරී කමිටුවට ඉදිරිපත් කළ යෝජනාවට අනුව "යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව අතර වෙළඳාම ආශ්‍රිත සහාය: කලාපීය හා යුරෝපා සංගමයේ වෙළඳ පොළ තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වෙළඳ තරඟකාරිත්වය වර්ධනය කිරීම" යන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

යුරෝපා සංගමය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා යුරෝ මිලියන 8ක අරමුදල් සම්පාදනය කිරීම සඳහා එකඟ වූ අතර, අන්තර් ජාතික වෙළඳ මධ්‍යස්ථානය (ITC) හා එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) මෙහි ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර ව්‍යාපෘතියේ රජයේ සම්බන්ධීකාරක ආයතනය වනුයේ වාණිජ දෙපාර්තමේන්තුවයි.

මෙම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ වෙළඳාම අභිමුඛ වර්ධනය හා කලාපීය ඒකාබද්ධතාවය සඳහා දායකවීම සහ එමගින් දුගීබව තුරන් කිරීම සඳහා දායක වීමයි.

ඒ අනුව, පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර හතර ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් දියත් කර ඇත;

1. කඩිනම් ප්‍රතිචාර 1 (ER 1). ලෝක වෙළඳ සංවිධානය, කලාපීය ඒකාබද්ධතා ක්‍රියාවලිය, සහ යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (GSP+) මඟින් හැඩගැස්සුනු ප්‍රතිපත්ති, නියාමන ප්‍රතිසංස්කරණ හා වෙළඳ එකඟතා ඇතුළුව අපනයන තරඟකාරිත්වය හා බැඳුණු වෙළඳ ක්‍රමෝපාය සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

2. කඩිනම් ප්‍රතිචාර 2 (ER 2). සාක් සංවිධානයේ හා යුරෝපා සංගමයේ වෙළඳ පොළවල් වෙත අපනයනය කිරීමට අනුකූලවීම සඳහා දේශසීමා ක්‍රියාවලි හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායවල ශක්‍යතා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

3. කඩිනම් ප්‍රතිචාර 3 (ER 3). කලාපීය හා යුරෝපා සංගමයේ වෙළඳ පොළවල්වල ගුණාත්මකබව සම්බන්ධිත හා ස්වස්ථ හා ශාක ශාක ස්වස්ථ (SPS) අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩිදියුණු කළ අනුකූලතා හා ගුණාත්මක යටිතල පහසුකම්.

4. කඩිනම් ප්‍රතිචාර 4 (ER 4). අපනයන අභිමුඛ ක්ෂේත්‍රයන්හි (කුළුබඩු, ආහාර සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කාර්මාන්ත) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායවල තරඟකාරිත්වය ඉහළ නැංවීම.

2018 වර්ෂය තුළදී, යුරෝපා සංගමය-ශ්‍රී ලංකාව අතර වෙළඳාම ආශ්‍රිත සහාය ව්‍යාපෘතිය යටතේ වාණිජ දෙපාර්තමේන්තුව හා සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර වෙළඳ සංවිධානය විසින් සංවිධානය කළ ප්‍රධාන තාක්ෂණික සහාය වැඩසටහන් පහත සඳහන් පරිදි වේ;

1. 2018 ඔක්තෝම්බර් මාසයේදී රජයේ ආයතන හා නැව් නියෝජිතායතන වලින් සහභාගීවූවන් සඳහා මුදල් අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් සමුද්‍ර, සැපයුම්දාම හා ප්‍රවාහන ප්‍රතිසංස්කරණ පිළිබඳ පැවති වටමේස සාකච්ඡාව හා රාජ්‍ය පෞද්ගලික සංවාදය (PPD).

2. රජයේ ආයතන, කාර්මික සංවිධාන, විශ්වවිද්‍යාල ආචාර්යවරු, කර්මාන්ත මණ්ඩල ආදිය සඳහා "ඩිජිටල් වෙළඳ පොළ වඩා සාධාරණීකරණය" කිරීම සඳහා විද්‍යුත් වාණිජ්‍ය ක්‍රියාත්මක සැලසුම (roadmap) සහ නිර්දේශ සම්බන්ධව 2018 මාර්තු මස පැවති රාජ්‍ය පෞද්ගලික සංවාදය (PPD).

3. රජයේ ආයතන, විශ්වවිද්‍යාල ආචාර්යවරු, කර්මාන්ත මණ්ඩල ආදිය සඳහා පැවැත්වූ "නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs): ප්‍රවණතා හා වර්තමාන පරිචයන්" සහ "වෙළඳාමේ ආර්ථික කටයුතු හා සංවරණය පිළිබඳ තාක්ෂණික ශක්‍යතා වර්ධනය" (මොඩියුල II පුහුණුව) සම්බන්ධ පුහුණු.

4. 2018 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවේ රජයේ හා පෞද්ගලික අංශයේ නියෝජිතයන් 34 දෙනෙකු සඳහා වූ "වෙළඳ ප්‍රතිකර්මවල හරය හා ක්‍රියාපටිපාටිය" පිළිබඳව ලෝක වෙළඳ සංවිධානයේ නීතිය සම්බන්ධ උපදේශක මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ විඩියෝ පාදක පුහුණුව.

5. රජයේ ආයතන, වෙළඳ මණ්ඩල හා පර්යේෂණ ආයතන සඳහා 2018 ජූනි මස පැවැත්වූ "ආයෝජන එකඟතා සහ හා ආරවුල් නිරාකරණය" සම්බන්ධ පුහුණුව.

6. 2018 සැප්තැම්බර් මස පැවැත්වූ ලෝක වෙළඳ සංවිධානයේ ස්වස්ථ හා ශාක ස්වස්ථ (SPS) ගිවිසුම හා ශ්‍රී ලංකාවේ අපනයන සමාගම් සඳහා එහි නෛතික බලපෑම්වල අදාළත්වය.

7. 2018 සැප්තැම්බර් මාසයේ පැවති වෙළඳ ප්‍රතිපත්තිය සම්බන්ධ නිපුණතාවය මැයෙන් හාවඩ් කෙනඩි ස්කූල්හි විධායක පාඨමාලාව සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ හා රජයේ අනෙකුත් ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වය.

8. රජය හා පෞද්ගලික අංශය සඳහා 2018 ඔක්තෝම්බර් මස පැවති වෙළඳ ප්‍රතිකර්ම පිළිබඳ මූලික පුහුණුව.

9. ජාතික තනි කවුළුව (NSW) සම්බන්ධ රාජ්‍ය-පෞද්ගලික සංවාද (PPD) 04ක් පැවැත්වීම : පළමු PPD සංවාදය - ජාතික තනි කවුළුවේ ප්‍රායෝගික විෂය පථය, දෙවන PPD සංවාදය - මැයි මස පැවැත්වූ ජාතික තනි කවුළුවේ පාලන යාන්ත්‍රණය, තෙවන PPD සංවාදය - ජූලි මස සාකච්ඡා කෙරුන ජාතික තනි කවුළුව සඳහා මෙහෙයුම් ආකෘති, සිවුවන PPD සංවාදය -ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුවේ (NTFC) සාමාජික ආයතන හා පෞද්ගලික පාර්ශව සමඟ 2018 සැප්තැම්බර් මස සාකච්ඡා කළ ජාතික තනි කවුළුව ක්‍රියාත්මක කිරීමේ ගැටලු.

10. 2018 දෙසැම්බර් මස මහනුවර හා කුරුණෑගල දී පැවැත් වූ යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (GSP), ලියාපදිංචි අපනයනකරුවන්ගේ පද්ධතිය (the REX system) හා වෙළඳ තොරතුරු ද්වාරය (TIP) පිළිබඳ ප්‍රදේශීය වැඩමුළු.

11. ජාතික වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුවේ (NTFC) සාමාජිකයන් සඳහා 2018 අගොස්තු හා සැප්තැම්බර් මාසවල සංවිධානය කළ ශක්‍යතා සංවර්ධන අධ්‍යයන චාරිකා.

12. 2018 මාර්තු මාසයේදී ජාතික අපනයන අලෙවිකරණ සැලසුම්කරණය (EMP) පිළිබඳ පුහුණුකරුවන් 05 දෙනෙකු පුහුණු කිරීම සහ වාණිජ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ හා SLASSCOM සංගමයේ සහභාගිකරුවන් 09 දෙනෙකු EMPපුහුණු කිරීම් ක්‍රමවේදය සම්බන්ධයෙන් පුහුණු කරන ලදී.

13. යුරෝපා සංගමයේ රටවල පැවැති වෙළඳ ප්‍රදර්ශන 04ක්/ව්‍යාපාරික හමු (B2B events) 03ක් සඳහා සහභාගි වීම සඳහා ප්‍රතිලාභී සමාගම් 15ක් සඳහා අරමුදල් ලබාදෙන ලදී. (2017 නොවැම්බර් මස ලන්ඩන් නුවරදී ව්‍යාපාරික රැස්වීම් 04ක් පැවැත්විණි.; 2018 පෙබරවාරි මාසයේදී පැවති බාසිලෝනාහි පැවති ජංගම දුරකතන සම්බන්ධිත ලෝක සම්මේලනය (MWC) රැස්වීම 04; හැන්නෝවර් හි 2018 ජූනි මස පැවැති ජාත්‍යන්තර පරිගණක ප්‍රදර්ශනය (CEBIT ) ආශ්‍රිත රැස්වීම් 10; 2018 ජූනි මස ලිවර්පූල්හි පැවති කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීමට අදාළ “SheTrades” සම්බන්ධිත රැස්වීම් 03).

14. වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රතිකර්ම ඒකකය සඳහා අනුයුක්ත නිලධාරීන් සඳහා 2018 දෙසැම්බර් මස පැවති වෙළඳ ප්‍රතිකර්ම සම්බන්ධ පුහුණු සැසිවාරය.

15. වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළඳ තොරතුරු ද්වාරයේ කණ්ඩායම සඳහා 2018 දෙසැම්බර් මස පැවති කාර්ය බද්ධ සංවර්ධන වැඩමුළුව.

## 7. ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම

පහත සඳහන් වරණීය යෝජනා ක්‍රම සහ කලාපීය, ද්විපාර්ශ්වික හා නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරන ශ්‍රී ලංකාවේ සම්භවය සහිත නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කරනු ලැබේ.

- ✓ වරණීය පොදු ක්‍රමය (GSP)
- ✓ ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- ✓ දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- ✓ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ✓ ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- ✓ පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ✓ ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

සාමාන්‍ය වැඩ කරන දිනයකදී , වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 300 කට අදාළ අවශ්‍ය කාර්ය නිමකර එම සහතික නිකුත් කරනු ලැබේ. පූර්ණ කාලීනව ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමේ අංශයට අනුයුක්ත කර ඇති ඒ සම්බන්ධ ඉහළ විශේෂඥ දැනුම හා පලපුරුද්ද සහිත නිලධාරී කණ්ඩායම උපදෙස් ලබාදීම සඳහා සහ වැඩිදුර තොරතුරු පැහැදිලි කරදීම සඳහා සූදානමින් සිටියි. කලින් වේලාව වෙන් කර ගැනීමකින් තොරවම, රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක මොවුන් හමුවිය හැකි වේ. අදාළ පත්කර ඇති නිලධාරීන් දෛනිකව සාමාන්‍ය වශයෙන් උපදෙස් ලබාදීමේ කටයුතු 30-50 දක්වා සංඛ්‍යාවක් සිදු කරනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම වනාහි විවිධ වෙළඳ ගිවිසුම්/එකඟතා යටතේ අදාළ වන ප්‍රභවස්ථාන රීති නිර්ණායක සම්බන්ධ ගැඹුරු දැනුමක් අවශ්‍ය කෙරන ඉහළ විශේෂඥ කාර්යයකි. මේ සම්බන්ධව වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ;

අ. තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාවය තක්සේරු කිරීම

ආ. අපනයනකරුවන්ගේ තොරතුරු (exporters' profiles) ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යෑම

ඇ. යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අපනයනකරුවන් විසින් සපයනු ලබන පිරිවැය ප්‍රකාශන හා අනෙකුත් ආධාරක ලේඛන ඇගයීම

ඈ. වරණය ලබාදෙන රටවල ඉල්ලීම පරිදි ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ

ඉ. ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත හා විශ්ලේෂණ වාර්තා සැකසීම

**වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ප්‍රභවස්ථාන සහතික (2016-2018)**

| ගිවිසුම් | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|
| | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් සංඛ්‍යාව | සමස්ත අපනයන වටිනාකම ඇ.ඩො.මිලියන වලින් | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් සංඛ්‍යාව | සමස්ත අපනයන වටිනාකම ඇ.ඩො.මිලියන වලින් | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් සංඛ්‍යාව | සමස්ත අපනයන වටිනාකම ඇ.ඩො.මිලියන වලින් |
| යුරෝපා සංගමයේ වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (EU GSP) | 74,003 | 2,243.51 | 80,867 | 2473.91 | 43,680 | 2665.28 |
| වෙනත් රටවල වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (GSP Other Countries) | 12,495 | 1,150.22 | 12,468 | 1429.47 | 10,884 | 1262.42 |
| ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 12,621 | 375.16 | 12,864 | 442.29 | 12,882 | 481.00 |
| පකිස්තාන් -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 6,673 | 51.52 | 6,703 | 60.33 | 5,265 | 51.00 |
| ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) | 4,508 | 125.6 | 6,038 | 150.8 | 4,290 | 156.98 |
| දකුණු ආසියානු වෙළඳ ගිවිසුම (SAFTA) | 149 | 6.89 | 679 | 41.07 | 557 | 35.42 |
| දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) | 288 | 3.4 | 277 | 4.49 | 239 | 3.54 |
| ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) | 143 | 45.14 | 100 | 81.2 | 143 | 92.58 |
| **එකතුව** | **110,830** | **4,001.44** | **120,277** | **4,683.56** | **77,940** | **4748.22** |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

## 8. වාර්ෂික ගිණුම - 2018

**ශීර්ෂ අංකය: 295**

**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- වාණිජ දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය: 01**

**ව්‍යාපෘති අංකය: 01**

**පුනරාවර්තන වියදම්**

| විස්තරය | 2017<br>සත්‍ය වියදම<br>රු. ,000 | 2018<br>අනුමත ඇස්තමේන්තුව<br>රු. ,000 | 2018<br>සංශෝධිත ඇස්තමේන්තුව<br>රු. ,000 | 2018<br>සත්‍ය වියදම<br>රු. ,000 | 2018<br>ඉතිරිය<br>රු. ,000 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 51,357 | 55,400 | 57,980 | 56,249 | 1,731 |
| වෙනත් | 64,408 | 73,150 | 78,870 | 75,576 | 3,294 |
| එකතුව | **115,765** | **128,550** | **136,850** | **131,825** | **5,025** |

## මූලධන වියදම්

| වැය විස්තරය | 2017 සත්‍ය වියදම රු. ,000 | 2018 අනුමත ඇස්තමේන්තුව රු. ,000 | 2018 සංශෝධිත ඇස්තමේන්තුව රු. ,000 | 2018 සත්‍ය වියදම රු. ,000 | 2018 ඉතිරිය රු. ,000 |
|---|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **2,119** | **300** | **300** | **272** | **28** |
| ගොඩනැඟිලි හා ඉදිකිරීම් (2001) | 2,108 | 100 | 100 | 78 | 22 |
| වාහන (2003) | 11 | 200 | 200 | 194 | 6 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | **3,148** | **1,600** | **1,600** | **1,059** | **541** |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ (2102) | 991 | 800 | 800 | 583 | 217 |
| යන්ත්‍රෝපකරණ (2103) | 2,157 | 800 | 800 | 476 | 324 |
| **මානව සම්පත් සංවර්ධනය** | **2,077** | **2,500** | **4,000** | **3,800** | **200** |
| කාර්ය මණ්ඩල පුහුණු කටයුතු (2401) | 2,077 | 2,500 | 4,000 | 3,800 | 200 |
| **වෙනත් මූලධන වියදම්** | **5,828** | **6,000** | **8,000** | **7,675** | **325** |
| ආයෝජන (2202) 01. අපනයන වෙළඳ පොළවල් අනාවරණය කරගැනීම | 5,828 | 6,000 | 8,000 | 7,675 | 325 |
| **එකතුව** | **13,172** | **10,400** | **13,900** | **12,806** | **1,094** |